

# සීමාලංකාර සංග්‍රහ

# සන්නයං

# සිමාලඞ්කාරසංග්‍රහය.

සිං හ ලා චා ය්‍යී

## වාගීශ්වරස්ථවිරපාදයන් විසින්

වි ර චි ත යි.

## තද්ව්‍යාඛ්‍යානය

වැ ලි තො ට

අඹගහපිටියේ විහාරයෙහිවැඩවිසූ

පූ ජ්‍යා චා ය්‍යී

## ඤාණානන්දසිරිසද්ධම්මජෝතිපාල

මහාස්වාමිපාදයන්වහන්සේ විසින් විරචිතයි.

වැලිතොට අඹගහපිටියේ විහාරේ අධිකාරිතැන්පත්

ආ චා ය්‍යී

## බුද්ධසිරිතිස්සස්ථවිරපාදයන් විසින්

සංස්කරණයකරණලදි.

කො ළ ඹ

පරමවිඥානාර්ථ බෞද්ධ සමිතියේ සභාපතිතැන්පත්

ආර්. ඒ. මිරන්දමහතා විසින්

ශාසනාභිවෘද්ධිය සඳහා නොමිලයේ පරිත්‍යාගය පිණිස

හුණුපිටියේ ජිනාලඞ්කාරමුද්‍රායන්ත්‍රාලයෙහි

අච්චුගස්වනලදී.

1904.

All right Reserved,

# දැන්වීමයි.

සීමාලඞ්කාරසංග්‍රහ ව්‍යාඛ්‍යානයනම්වූ මෙම ග්‍රන්ථය කිසිවෙකු විසින් වෙළඳම්පිණිස අච්චුගස්වා නොවිකිණියයුතුවත් ඇර යම්කිසිවෙක් මෙම පොත නොමිලයේ පරිත්‍යාගය පිණිස නැවත අච්චුගස්වනවානම් ඔහු විසින් මෙහි නාම්සඳහන්වූ ආචාර්ය බුද්ධසිරිතිස්සස්ථවිරපාදයන්වහන්සේගේ සහ මාගේද අවසරය ඇතිව අච්චුගැස්විය යුතු.

ශම්වගට, ආර්. ඒ. මිරන්ද.

R. A. Miranda.

# සීමාලඞ්කාරසංග්‍රහය සහ එහි පදාර්ථ

## සන්නාහය සම්බන්ධ

## දිසාංශූපනිකස.

ශ්‍රී සත මුනීන්ද්‍ර අපශාස්තෘන් වහන්සේගේ ප්‍රවරොදර බුද්ධ භාරතීන් අතුරෙහි විද්‍යමාණ විනයප්‍රඥප්ති තොමෝ යම්හෙයකින් ප්‍රව්‍රජ්‍යාකුලපුත්‍රයන් ශික්ෂාප්‍රතිපත්තියෙහි යොදා ඔවුනට ප්‍රතිවෙධ සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්‍යාදි මාර්ගඵලාවබොධය කෙරෙමින් ශාසනස්ථිති ය කරන්නීවේද, එහෙයින් ඕතොමෝ සුපෙසල ශික්ෂාකාමී යතීන් විසින් සර්වප්‍රකාරයෙන් පරිශීලනය කටයුත්තීමය, එහි විද්‍යමාණ විවිධවිචිත්‍ර විනයක්‍රම අතුරෙන් සීමාලක්ෂණපරිඥානය වනාහී අති ශයින් දුර්බොධමැයි.

එහෙයින් විනයශික්ෂාන්තර්ගත සීමාවිභාගය සුවසේ උද්ග්‍රහණ ධාරණාවබොධයට සුදුසු පරිද්දෙන් සංක්ෂෙපකොට හකුළුවා පුරාණ සීමාලඞ්කාරගණ්ඨිය පද්‍යබන්ධනවශයෙන් සංග්‍රහකළාවූ සිංහලාචාර්ය වාගීශ්වර ස්ථවිරතෙමේ ලක්දිව බුදුසසුන බබුළුවාලූ මහාස්ථවිරවරයන් අතුරෙහි ප්‍රභව සංභාවනීය ස්ථවිරතුමෙකි.

ඒබැව් සාසනාවතාරනම් ප්‍රකරණයෙහි "ඒකශ්‍රැතීක් නෙක සහස්‍රග්‍රන්ථධාරණයෙහි සමර්ථවූ වජ්‍රඥාන ඇති ශාරිපුත්‍ර මහාස්වාමිපාදයන් පටන් සඞ්ඝරක්ෂිතය-සුමඞ්ගලය-වාගීශ්වරය-ධම්මකීර්තිය-නාගසෙනය-ආනන්දය-වෛදෙහය-බුද්ධප්පියය-අනවමදර්ශිය-යනාදී මහාස්ථවිරවරයෝ නොයෙක් ටීකාටීකාථා හා—තත්ප්‍රවෙශොපායවූ අනෙකප්‍රකාර ධර්මප්‍රබන්ධහා සන්න-ගැටපද-පිටපත්-ආදිය උපදවා බුදුන්ගේ පර්යාප්තිශාසනය බැබළවූහ" යන්නෙන්ප්‍රකාශිතයි, මෙම වාක්‍යයෙන් දක්වූ මහාස්ථවිරවරයන්අතුරෙහි සීමාලඞ්කාර සංග්‍රහ කර්තෘභූතවාගීශ්වර ස්ථවිරපාදයන්වහන්සේද—තදන්තර්ගතකොට දක්වා තිබේ.

තවද යම් සිංහලාචාර්ය වාගීශ්වර ස්ථවිරකෙනෙකු විසින් සීමාලඞ්කාරසංග්‍රහය තෙම රචනාකරණලද්ද ඒ වාගීශ්වරතෙරුන් විසින්ම සීමාලඞ්කාර වර්ණනාවද සැකවින් කරණලද්දීය, ඒ බැව්

යෙන වීරචිතො ආසී සීමාලඞ්කාරසඞ්ගහො
තෙනෙව රචිතා තස්ස වණ්ණනාපි සමාසතො.

යන ගාථායෙන් ප්‍රකාශයි, එපණක් නොව ශ්‍රී පරාක්‍රමබාහු මහරජාණන් දවස රාමඤ්ඤරට අරිමද්දනපුරයින් ලක්දිවට පැමිණ ධම්මවිනය ශබ්දශාස්ත්‍රාදිය පුහුණුකිරීමෙන් මහාපණ්ඩිතයෙක්වූ, ඡපපදමහතෙරුන් විසින්ද, මෙම සීමාලඞ්කාර සංග්‍රහයට අතිසංක්ෂෙප වර්ණනාවක් කොට තිබෙයි. පිටකත්‍රයපාරදර්ශී ඡපපදාචාර්යයන් විසින් කරණලද "සීමාලඞ්කාරසංගහ වණ්ණනා" නම්වූ ටීකාවෙහි කත්‍රු නාමසන්දර්ශනාදිය සඳහන්කොට ඇති ගාථාවන් අතුරෙන් එකදගාථාවක් මෙහි දක්වමි.

සබ්බඤ්ඤුතන පිටකත්තයපාරදස්සී
සො ඡපපදව්හයසුතො යතිරාජපුත්තො
සීමාලඞ්කාරණ සංගහවණ්ණනෙතමං
සංඛෙපතො විරචයී මුනිසාසනඤ්ඤං–සී.

මෙම සීමාලඞ්කාරසංග්‍රහයෙහි පෞරාණිකත්වාදිය හා ග්‍රන්ථවිශෙෂ ගෞරවාභිඥාදිය සලකාගැන්මට මෙහි ඉහත දැක්වූ කරුණු ප්‍රමාණවෙයි, සීමාලඞ්කාරනම්වූ මෙම ග්‍රන්ථය ශ්‍රී බුද්ධ වර්ෂ 16෴8 ටට සහ 1958 ටටත් අතර කරණලද්දක් බැව් සාමාන්‍ය වශයෙන් සිතිය හැකිය.

2 වැනි) අප සුගත ජිනෙන්ද්‍රයන් වහන්සේගේ පර්‍යාප්ති ශාසන ස්ථිතිකරණය සඳහා හෙළුබසින් මෙම සීමාලඞ්කාර සංග්‍රහ ව්‍යාඛ්‍යානය කළාවූ අසමදුවායකී(කහාවේ) ඤාණානන්ද සිරිසද්ධම්ම ජොතිපාල මහාස්ථවිරස්වාමිපාදෙනාම තෙමේ කවරකාලෙකාවිසූ කෙබඳු ස්වාභාවික සුඛවරයෙක්දැයි ඇතැම් ගිහිපැවිදි පඬිහු දනිතත් අවශෙෂ බොහෝදෙන ඒ කිසිත් නොදනිති, එහෙයින් තත්සම්බන්ධ ප්‍රවෘත්තිය මෙහි මදක් සඳහන් කරමි.

විබුධජනමනකුමුද විකාසනයෙහි නිසාකරයා වැනිවූ ඤාණානන්ද සිරිසද්ධම්ම ජොතිපාල මහාස්ථවිරපාදයන්වහන්සේ වැලිතොට අඹගහපිටියේ විහාරස්ථානයෙහි මීට සතළිස්නව වර්ෂයකට පූර්වකාලයෙහි ජීවත්ව වසමින් ලොකශාස්ත්‍රාභිවෘද්ධිය කළාවූ ගෞරවාභී පණ්ඩිතො

තනමසෙකි, උන්වහන්සේ උපන්නේ ශකවර්ෂ 1737 දිය, ප්‍රව්‍රජ්‍යාවට පැමිණියේ ඉතා කුඩාකාලයෙහිදීමය.

මේ ස්වාමිපාදයන් වහන්සේගේ ප්‍රව්‍රජ්‍යාචාර්යයන් වහන්සේ නම්=වැලිතොට අඹගහපිටියේ විහාරාධිපතිව විසූ බෝධිසත්වචරිත්‍ර ඇති කුළුණුසයුරෙහි ගැළුනු ඤාණවිමලතිස්සාභිධාන මහානායක ස්ථවිර පාදයන් වහන්සේය.

මේ මහාවීරයන් වහන්සේ උඩරට උපාලිවංශය ප්‍රතිෂ්ඨාපනයෙහි අනුශාසක නැන්පත් කප්කුජර කෙශරීඥායමානවූ වැලිවිට සරණංකර සඞ්ඝරාජ මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගෙන් ප්‍රව්‍රජ්‍යාව හා ශබ්දශාස්ත්‍රාද්‍යුග්‍රහණයද ලබාගෙණ ලක්දිව නානාජාතික බෞද්ධලොකයා කෙරෙහි කරුණාපෙරදැරිව අභිතකෙශර සිංහරාජයකුමෙන් ජීවිතාපෙක්ෂාව නොකොට පරාර්ථසම්පාදනය ගරුකොට සලකා, ප්‍රව්‍රජ්‍යාශිෂ්‍යයන් පස්නමක් හා කප්පියකාරාදීන් කැටිව, ශ්‍රීරාජාධිරාජ නරපතීන්ගේ කාලයෙහි එනම් ශ්‍රී බුද්ධ වර්ෂ 2342 කේදී ලක්දිවින් නික්ම බුද්ධ වර්ෂ 2344 රේදී බුරුමරටට අමරපුරනගරයට පැමිණියේය.

එහිපැමිණ සිරිපවරවිද්‍යාතනගන සඞ්ඛ්‍යාතපුරාදීනායාධිපති ජගින්ද මහාධම්මරාජාධිරාජ පෘථුවීශ්වරයන්ගෙන් ද්‍රව්‍යධර්මාමිසානුග්‍රහ ලබමින් එමවර්ෂයෙහිදීම ඤාණාභිවංශ ධම්මසේනාපති සඞ්ඝරාජ මහාස්ථවිරප්‍රමුඛ එකපණ්ණාසමාත්‍ර සුප්‍රතිපන්න මහසඞ්ඝයා වහන්සේගෙන් එකාදස විපත්තියෙන් තොරවූ ත්‍රිවිධ සම්පත්තියෙන් යුක්තවූ සුවණ්ණගුහානම් බද්ධසීමාවෙහිදී නිර්මලප්‍රව්‍රජ්‍යොපසම්පදාව ලබාගැන්මෙන් හා යථොක්ත උපසම්පදාමඞ්ගල්‍යානුසවපරිදීපක කණ්ණරසායන මධුරකොමල පදාවලියෙන් යුත් සඞ්ඝරාජ සන්දෙසකථාවක්ද—එසේම රාජාධිරාජ පෘථුවීශ්වරයන්ගෙන් රාජමුද්‍රිකා පිහිටුවනලද ගෞරවාහී රාජාධිරාජ සන්දෙසකථාවක්ද—එසේම නිස්සායාචාර්ය අග්‍රසාරමහාස්ථවිර ප්‍රමුඛ බහුශ්‍රැත බුරුමතෙරවරු සිව්නමක්ද--ලබාගෙණ මෙහිපැමිණ අමරපුරනිකාය ප්‍රතිෂ්ඨාපනයකර වදාළේය.

ලක්දිව අමරපුරනිකාය ප්‍රතිෂ්ඨාපනයෙහි ආදි පුරුෂොත්තම වූයේ යථොක්ත ඤාණවිමලතිස්සාභිධාන මහානායක ස්ථවිර පාදයන් වහන්සේමය, මේ ස්වාමිපාදයන් වහන්සේට ක්‍රිස්තු වර්ෂ 1825 දී නෙකශ්‍රීන් විරාජමාන ගරුතර ගොවැර්නදෝරු ජනරාල් ශර්

එඩ් මාර්ඩ් බාර්නස් උතුමානන් වහන්සේ විසින් ලංකාභූව සම්බ
න්ධ නොයෙක් බැදු පිහිටුවා දෙවාවදල නායකපදවියක් ඇතිව අමර
පුරනිකායේ මහාමහොපාධ්‍යාය ස්ථවිරවරයෙක්ව වැඩවිසුයේය.

තදන්තෙවාසිකභාවොපගත නෙකශාස්ත්‍රප්‍රවීණ ධම්මාධාරනී
ඝකාභිධාන මහානායක ස්ථවිරපාදයන් වහන්සේ ඤණානන්දාභිධෙය
ධම්ම ජෝතිපාල මහාස්ථවිර පාදයන් වහන්සේගේ නිශ්‍රය ධම්මා
චාර්යයන් වූහ.

සජ්ජනානන්දකර ඤණානන්දතිස්ස යතීශ්වරයන්වහන්සේ වනා
හි දුටුවන්පහදනා මනොහර රූපශ්‍රියකින්හා පුදුමධාරණ ශක්තිය
කින්ද යුක්තව ලදරුකාලය ගතකලේය, ගුරුවරාදීන්ට සුවචකීක
රුකමින් හා ශික්ෂාප්‍රතිපත්තියෙහි නියැලිව විසුයේය, මේ උතුමා
කුඩාකාලයෙහිදීම ශබ්දශාස්ත්‍රය දැනීමෙහි සමතෙක්යයි ලොකප්‍රසිඩ
විය, මේ ස්වාමිපාදයන්වහන්සේගෙන් ධම්මශ්‍රවනාදියකලාවූ ඇ
තැම් අය මේ දක්වාත් ප්‍රශංසාකෙරෙති, මාගධ සංස්කෘත ව්‍යාකරණා
දිය සම්බන්ධ ඒ ඒ කුඩා පොත්හැර කච්චායන, බාලාවතාර, සාරස්ව
ත, පාලිනිඝණ්ඩු, අමරකොෂ, යන පොත් වාගෙවාද්ගතකොට තිබ්,
විනයධම්මය පිළිබඳ උභයප්‍රාතිමොක්ෂය හා කුදුසිඛ, මූළසිඛ, ප්‍රගු
ණය, අභිධම්මයපිළිබඳව ස්වකීය ආචාර්යවරයන්වහන්සේගේ නි
යමයවූ පරිද්දෙන් අභිධම්මාර්ථසංග්‍රහය එක්පක්ෂයක්තුල පාඩම්ක
ලේය, මේ උතුමාගේ ග්‍රන්ථධාරණයෙහි පටුබව පුරාතනයන්
ගේ ත්‍රිපිටකධාරණාදියට සමකලාම පුදුමයක්නොවන නමුත් ඉදානී
න්තන යතීන්ගේ ග්‍රන්ථධාරණ සාමර්ථ්‍යය අනුස්මරණය කලාම ඒ
ඉතා ආශ්චර්යයක්මය, මෙම ස්වාමිපාදයන්වහන්සේ යථොක්ත
තන්ත්‍රායාගත සව්‍යාකරණ මාගධාදි භාෂාවන් මදකලකින්ම මොන
වට හසලේය,

තදනන්තරව මෙම ස්වාමිපාදයන්වහන්සේට සංස්කෘතශාස්ත්‍රා
ද්ග්‍රහනයෙහි ධම්මාචාර්යයන්වූයේ නෙකශාස්ත්‍රරත්නාකරනිස්සර
නයෙහි ස්වර්ණතොයකායමානවූ මාතොට බෝවල ධම්මානන්දාභිධාන
මහානායකස්ථවිර පාදයන්වහන්සේය,

මේ මහානායකස්ථවිර පාදයන්වහන්සේ අප ස්වාමිපාදයන්
වහන්සේට සංස්කෘත ශාස්ත්‍රය පුහුනුකරවන කාලයෙහි ඇතැම් ඨා
නන්තරිකයෝ එය බාධාකරණුවස් කරුණුකීනමුදු එය පිළිනො
ගෙණ ඒ ගැණ දුත්පිළිතුර නම් සිංහලෙලය රත්බඳනකාචිනා
අන්බඳනා ගෞරාබදනටවන් ථව තිබි රත්බඳනක් ලැබිතිබෙනබව

න් ඔවුනොවුන්කෙරෙහි ඊර්ෂ්‍යාමාන නොකටයුතු බවත් ආගමනසින් කියා තේරුම්කරදීම පමණක්ය.

මෙසේ ස්වකීය ආචාර්‍ය්‍යවරයන්ගේ අතිශය භක්ත්‍යාදර නමැති ක්ෂීරාර්ණවයෙහි නිමග්නවූ ඒ යතිශ්වරතෙමේ අභිප්‍රානුකූල පරිද්දෙන් සංස්කෘතශාස්ත්‍රාද්ග්‍රහනය අප්‍රමාදවකොට නිමවා ගුරුවරණාභිවාදනයකිරීමෙන් අවසරලබාගෙණ සියවෙහෙරටපැමිණියේය.

එහි පැමිණ ලෝකශාසනාභිවෘද්ධිය කරමින් වසන අතර, අමරපුරනිකායික ස්ථවිරාදින් අතුරෙහි බද්ධාබද්ධසීමාවන් සම්බන්ධ සංකරවිවාදයක් හටගත්තේය, එය බලවත්ව භික්ෂූන්අතර පැතිරයාමෙන් සපිරව තිබීගිය ප්‍රියතර සංඝසාමග්‍රිය භින්නවූයේය, එහෙයින් භික්ෂූහු නානාවර්ගී නානානිකායිකයෝවූහ.

මෙම සාමග්‍රිභේදය හේතුකොටගෙණ අප ස්වාමිපාදයන්වහන්සේ අතිසය සංවේගයට පැමිණියේ මෙත්සිත් පෙරදැරිව භේදයට පත් තෙරවරුන්ගේ සාමග්‍රියහා, ඔවුනොවුන්ගේ සංකාපරිහරණය පිණිසද මාගධභාෂාව නොදත් යතීන්ගේ සීමාලක්ෂණ විජානනයහා ජිනවරශාසනාභිවෘද්ධිය පිණිසද යනාදී කරුණු සඳහා මෙම සීමාලඞ්කාරසංග්‍රහය සනහකොට එය දහම්පඬුරුකරණුවස් අදහස් කළෝය, ඒබැව් ''අයංපන මමුස්සාහො, යෙභුයෙය්‍යනාපකාරකො'' යනාදියෙන් ප්‍රකාශයි.

යථොක්තකරුණු අභ්‍යන්තරනිමිත්තකොට සීමාලඞ්කාරසංග්‍රහයෙහි ගාථාවන් සම්බන්ධවූ ගරුභාවනීය මෙම පදගතාර්ථසන්නය පමණක් කෙටුම්පතක ලියා සාමාන්‍යවශයෙන් නිමකලේවීනමුත් හෙද ව්‍යාඛ්‍යාන කර්තෘවරයන්ගේ අදහස්වූපරිදි සර්වප්‍රකාරයෙන් සම්පූර්ණකොට නිමවන්ට මන්දපුණ්‍යකවූහෙයින් නොපිළිවන්විය.

එපමණක් නොව මේ උතුමාගෙන් ලොසසුන් දෙකට ලබාගත හැකිවතිබීගිය අනෙකවිධ විපුලාර්ථයන් අතුරෙන් මහාග්‍රන්ථකර්තෘවරයෙක්වූ අමරපුර ගණපාමොක්ඛාචරිය **අග්ගවංසාලඞ්කාර විමලසාරතිස්සාභිධාන** මහානායකස්ථවිර පාදෙන්නමයන්හා **බල්තසර්මැන් දිස් වීරසිංහ වික්‍රමරත්න** මුදියන්සේරාලහාමින්නාන්සේ ඇතුළුවූ වැදගත් ගිහිපැවිදි ශිෂ්‍යසමූහයක් ඒ ස්වල්පකාලයතුල නැතිවපමණක් සාධිකවීනමුදු එයද දීර්ඝකාලයක් නොපැවැත්තේය, අහෝ !; සංස්කාරධර්ම ප්‍රවෘත්තිය අනිත්‍යමැයි.

අනෙකවාදීහස්තිහිවිද්‍රාවණයෙහි කෙශරීන්ද්‍රාසමානවූ විමත්ජන මනොනානන්දනීය ඥානානන්ද සිරිසද්ධම්මපණ්ණසාල මහාස්ථවිරපාද යන්වහන්සේ මෙහි ජීවත්ව වැඩසිටියේ හවුරුදු සතලිසක්පමණකි ඉකාරවූ මාරයාට වසඟවූයේ මෙහිපහසඳහන්වූ බුද්ධවර්ෂයෙහිදීය.

ශ්‍රීපචනුනවාෂ්ට ග්‍රහනවහුතභුජ් ලොචනෙ මත්ස්‍යගෙහේ
යොනාම්නෙව පූර්වපක්ෂෙ ශශිසුතදිවසෙ සප්තමධ්‍යාංශෙ
චාතුද්වීපස්ථාන්තපසෙ බුද්ධකුමුදවිධුර්නෙකශාස්ත්‍රප්‍රවීණො
ඥානානන්දයතීශඃ ප්‍රළයමුපගතඃ සවංයශඃ ශෙෂයිත්වා.

ශාකෙ ගොත්‍රනගශ්‍රී චන්ද්‍රගුණිතෙ රාශෞරශ්වෙ මාදශෙ
සංශෙප්‍රාලගුන ත්‍රීමහිවාසිශිශිරෙ ශුක්‍රෙලඥවාරෙ නිශි
ප්‍රාපෙනාකාදසහෙ කුලාමකුනිරෙ සත්සද්ගුණානාං නිධිර්
ඥානානන්දයතීශ්වරඃ කවිශිරො රත්නොපමාතං සොසපාශත්.

මෙම සීමාලඞ්කාරසංග්‍රහ සන්නය වනාහි එකම කොටුම්පතක් වූ හෙයින් එය ගුප්තව තබාගැනීමෙන් යම්කිසි ආකාරයකින් අප වත්වූවහොත් ව්‍යාඛ්‍යානකර්තෘවරයන්ගේ ශ්‍රද්ධාධ්‍යාශය මුදුන්පත් නොවෙයි, එයින් ලැබියහැකි මහත්ඵලයද ශාසනික කුලපුත්‍රයන්ට නොලැබෙයි, එහෙයින් මෙම ප්‍රකරණය ශාසනාභිවෘද්ධිය සඳහා මුද්‍රනය ට සුදුසු පරිද්දෙන් සංස්කරණයකොට, කොළඹ මරදානේ සිරිවිම නතිවැසි ලොකප්‍රසිද්ධ ශ්‍රී [illegible] බෞද්ධ සමිතියෙ සභාපතිතැන් පත් සත්ගුණවත් ආර්. ඒ. මිරැන්ඩො මහතාණන් ශාසනාභිවෘද්ධිය සඳහා නිතරපැවති ධනපරිත්‍යාගය [illegible]කොටගෙණ මුද්‍රනයකරවා ආචාර්ය්‍යයාගත සද්වෘත්ති නොපිරිහෙලා නොමිලයේ දහම්පඬුරු කරණුවස් අදහස්කොට මුද්‍රනයකරවූ [illegible]මි, එබැවින් මෙම ග්‍රන්ථය කිසිකලෙක කිසිවෙකු විසින් වෙළඳම්පිණිස අවඩුගස්වා විකුට එයින් උදරපොෂණාදිය නොකටයුතු,

මේවගට, වැලිතොට අඹගහපිටියේ විහාරෙසත්‍යාධිපති

ආචාර්ය්‍ය බුද්ධසිරිතිස්ස නෛරුන්නාන්සේය,

ශ්‍රී බුද්ධවර්ෂ 2447 වැනි වසෙහි මාසනම්වූ යාවාධිමාස

ද්විතියාසාළ්හපරපක්ෂතෙළෙස්වැනි දිනදීය.

# සඤ්ඤාපනං.

1. යො සො සීහළදීපතො මරපුරං ගන්ත්වා පුරම්මං ඉතො
පබ්බජ්ජෙත්වා ස පරක්කසිඛිවතුලං ඤාණං සසිංසෙසති ච
තස්මිං ධම්මිකභූභුජෙන මහතා පෙමෙන සුපසීතො
නිස්සාසුත්තාම සංඝරාජයතිනො චිත්තප්පසාදං පරං.

2. පබ්බජ්ජං චුපසම්පදඤ්ච විමලං ලද්ධාන සද්ධාධනො
පච්චාගම්ම තතො මරම්ම විසයා සද්ධම්මරාජත්‍රජො
දීපෙ සොතාවිය බොධිසත්තචරිතං සංබුද්ධසංවණ්ණිතං
දීපෙ සාසනදීපමත්‍රමුනිනො ජොතෙසි දීපප්පදං.

3. ලඞ්කාලඞ්කාරභූතො † මතිවිමල මහාථෙර පාදුණ්ණරංසි
ලඞ්කාවෙහාසසං සො මිතමතිප්‍රතිය ලඞ්කරී දීඝකාලං
සම්මා තෙනප්පබුද්ධො කවිජනතිකරාළිති සංසෙවිතො ඉතො
ධම්මාධාරාභිධානක්ඛවිර සරසිජෝපම්‍යාසි මස්මිංතදූනී.

4. සුත්තාභිධම්මවිනයෙව ස සද්දසත්ථෙ
භාසන්තරෙච සමයන්තරනෙකසත්ථෙ
සො පූජිතො අභවි බ්‍යාතකවීසු ඤාණා
ණඤ්ඤ මහා යතිවරො පි තදෙව හොසි.

5. සොයං ගතිස්සරවරො ඉධ අම්බරුක්ඛා
රාමම්හි අප්පතරකාලමතික්කමිත්වා
පාමොජ්ජභාග ඉධ වෙණ්ණසිකාන මග්ගං
ව්‍යාඛ්‍යං ඉමං විරචයී නිජභාසතොධ.

---

† "මතිවිමල" යනමෙහි "මති" ශබ්දය "ඤාණ" ශබ්දය හා සමාන පර්යායයි, එහෙයින් "ඤාණවිමල" යි යෙදිය යුතු තැන "මතිවිමල" යි යෙදීමද, "ආනන්දරසාඤ්ඤ රතනාදි මහායතින්ද" යනාදී මහාකවිප්‍රයොග පැනෙනහෙයින් උපාදෙයමැයි.

6. ලඞ්කාදීප බ්‍රහ්මබුජාකරවරෙ සඤ්ජාතමාසුදිතං
ධම්මාධාර යතිස්සරම්බුද්දයා සීතාමතා වස්සතා
සඤ්ඤාණාඞ්කෙසතිස්ස කාජ ගලිතං ව්‍යාඛ්‍යානවාණී මධුං
පීත්වෙතං මුදිතා භවන්තු සුජනා සීමාවිභාගෙරතා.

7. අස්මිං හි ගන්ථවිසයෙ ජනිතං පමාද
භාවාය කිඤ්චි ඛලිතං යදිචෙ භවෙය්‍ය
තංචාපි වාරු ජලමිස්සපයං පිවන්තා
හංසාව සාධුකවිනො පරිවජ්ජයන්තු.

8. සො තො ගරු සුමතිමා මුනිසාසනම්හි
කත්වාන ඨානක ඵලදාන සුසුක්ඛකම්මං
සිලාදූනානු පටිපත්ති සුඛානු භුත්වා
සෙසෙස්වහා ඉධ සුසුඩ සිලොක කායං.

---

9. ඩිරණ්ණවතරගාහ පත්ථෙවාදුතකිත්තිමා
සීලාදිගුණසම්පන්නා විසුද්ධපටුබුද්ධිමා.

10 භාසන්තරෙස්වනෙකෙසු කොසල්ලන්තමුපාගතො
සඤ්ඤාණාඞ්කුමහාසාමි ථෙරපාදෙති පාකටො.

11 සො මහාථෙරපාදෙව උභතො සුඛීයාමමං
දත්වා දුල්ලභ පබ්බජ්ජං ආචෙරත්තමුපාගමි.

12 ධම්මාධාරෝ ස ථෙරින්දු සාසනම්බරමුග්ගතො
සිස්සකුසුකරෙමෙත්තා කනාතියා කා විකාසිනී.

13 සල්ලබගුණසම්පන්නො ධම්මානන්දෙති විස්සුතො
ථෙරපාදෙ භවි සඤ්ඤු සාසනස්මිං විසාරදෙ.

14 ඛ්‍යාතො විමලසාරොති ගරුභාවමුපාගතො
අරියවංසාලඞ්කාර නාහො මණී කවිස්සරො.

15 අම්බරුක්ඛාරාමනාම විහාරොදය මණ්ඩිකං
පත්වා සසිස්සකමලෙ විකාසෙන්තො වසී තහිං.

16 තෙසං පාදරජාකිණ්ණ බනාති සුඛබව වුත්තිනා
මාරපාස විමොක්ඛත්ථ මියගමගහානු වත්තිනා.

17 අම්බරුක්ඛාරාමනාම විහාරෙ වසතා ධුතා
බුද්ධිසිරි සමඤ්ඤෙන ථෙරෙන කතවෙදිනා.

# සීමාලඞ්කාර සංග්‍රහ සන්නය.

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

මහාවීරෙන යෙනායං පත්වා ලොකෙ තිසම්පදං,
සුඛිතො සුගතං වන්දෙ ගම්භිරම තිසම්පදං.

මග්ගඤ්ඤුස්ස ස මග්ගාප සඞ්ගවග්ගප්පහජ්ජනො,
මග්ගාසග්ගාපවග්ගානං මග්ගො පාතු සිරිඝනො.

වාචිස්සරාභිධානෙන සීහළාචරියෙන යො,
ගාථාහි රචිතො සම්මා සීමාලඞ්කාරසඞ්ගහො.

තමහං දීපභාසාය සාසනත්ථං මහෙසිනො,
වණ්ණයිස්සාමි නිස්සාය ගරූනං වණ්ණනානයං.

අපි ඡප්පටථෙරෙන කතං තස්සත්ථවණ්ණනා,
සාගී මාගධිකානංව පමොදජනනී භුසං.

අයං පන මනුස්සානං යෙභුය්‍යෙනොපකාරකො,
භික්ඛූනං දීපවාසීනං මූලභාසමජානතං.

තස්මා බද්ධාදිසීමානං පවත්තිපටිපත්තියා,
අවික්ඛිත්තෙන චිත්තෙන සුණන්තු මම භාසතො.

ප්‍රකරණාරම්භයෙහි රත්නත්‍රයට නමස්කාර කරණය සදාචාරානුරක්ෂණාදිය පිණිස පවත්නා හෙයින් පුරාණ සීමාලඞ්කාර ප්‍රකරණය ගාථා වශයෙන් සංග්‍රහකොට කරණු කැමැති සිංහලාචාර්‍ය්‍ය වාගීශ්වරස්ථවිර පාදයෝ, යම් හෙයකින් බුද්ධරත්නය විෂයෙහි පවත්වන ලද නමස්කාරය ධර්‍මසංඝසංඛ්‍යාත ඉතර රත්නද්වයෙහිදු තදවිනාභාවිත්වයෙන් පවතීද, එහෙයින් බුදුන්ට නමස්කාර දක්වන්නාහු, භාග්‍යවතුන් වහන්සේගේ ශීලසමාධ්‍යාදි අනන්තාපර්‍ය්‍යන්ත ගුණ ඇතත් ග්‍රන්ථානුරූපගුණයෙන් ස්තුතිකොට නමස්කාර දක්වනු පිණිස "වන්දිත්වාලංසං" යනාදි ගය කීහු.

1. වන්දිත්වාලංඝ්‍යපල්ලඞ්ක යුගන්ධරනගොදිතං,
බුද්ධෙනං ධම්මගොඵුල්ල සංඝපඞ්කජකානනං.

අලංඝ්‍ය,- (පොළෙල් තෙලෙහි පටන් මත්තෙහි අජටාකාශය දක්වා මෙදතුරෙහි දෙව්බඹ නා ගුරුළු ඈ කිසිසතෙක් විසින්) ඉක්මිය නොහැක්කාවූ; පල්ලඞ්ක, වජ්‍රපර්‍ය්‍යඞ්ක නමැති; යුගන්ධරනග, යුගන්ධර පර්‍වතයෙහි; උදිතං, පහළවූ; ධම්මගො, පර්‍ය්‍යාප්ති ධර්‍ම නමැති රශ්මියෙන්; ඵුල්ල, විකසිතවූ; සංඝ, අෂ්ටාර්‍ය්‍යපුද්ගල සමූහ නමැති; පඞ්කජකානනං, පියුම් වන ඇති; බුද්ධ ඉනං, සර්‍වඥ නමැති සූර්‍ය්‍යයා; වන්දිත්වා, කායාදිවාරත්‍රයෙන් නමස්කාරකොට.

හරිහයෙන්‍ෂ නිදසකරාද්‍රයඃ-යනු නිඝණ්ඩු බැවින් "ඉන,, ශබ්ද සූර්‍ය්‍යපර්‍ය්‍යාය වෙයි, "ධම්මගො,, යන තන්හි "ගො,, ශබ්ද—"ඉෂෞ භූමෞපශෞරශෙම්ෂු දිශිවාචි ජලෙක්ෂණෙ, ස්වර්ගෙ වජ්‍රෙච ගොශබ්දා දශස්වපෙක්ෂුදශ්‍යතෙ,,—යු බැවින් රශ්මියෙහි වැටෙයි, එහෙයින්ම මෙම සීමාලඞ්කාර සංග්‍රහයට කළ වර්‍ණනායෙහිද ඡප්පටතෙරුන් විසින් "බුද්ධ ඉනනාති,, සබ්බඤ්ඤුසංඛාතං සූරියංසිද—"ධම්මගොවුච්චති,, ධම්මරංසි-සිද විවෘතයි.

ලංඝිතබ්බොති ලංඝෙය්‍යො—නලංඝෙය්‍යො අලංඝෙය්‍යො—අලංඝෙය්‍යොච සො පල්ලඞ්කොචාති අලංඝ්‍ය පල්ලඞ්කො—චන්දසූරියසංඛාතං යුගං ධාරෙතීති යුගන්ධරො—යුගන්ධරොච සො නගොචාති යුගන්ධරනගො—අලංඝ්‍යපල්ලඞ්කො එව යුගන්ධරනගො අලංඝ්‍යපල්ලඞ්ක යුගන්ධර නගො—තස්මිං උදිතො අලංඝ්‍යපල්ලඞ්ක යුගන්ධර නගො දිතො—යනුද, බුද්ධො එව ඉනො බුද්ධෙනො—යනුද, ධම්මො එව ගො ධම්මගො—තෙහි ඵුල්ලං ධම්මගො ඵුල්ලං—පඞ්කජානං කානනං පඞ්කජකානනං—සංඝො එව පඞ්කජකානනං සංඝපඞ්කජකානනං—ධම්මගො ඵුල්ලං සංඝපඞ්කජකානනං එතෙනාති ධම්මගො ඵුල්ල සංඝ පඞ්කජ කානනො—යනුද වාක්‍යයි.

දැන් තමන්ගේ ප්‍රකරණයට නිශ්‍රයභා කරණ ප්‍රකාර ප්‍රයොජනයන් දක්වනු පිණිස,

2. සීමාලඞ්කාරකෙ වුත්තා යෙ අත්ථා දානි තෙ මයා,
වාචුග්ගතත්ථං භික්ඛූනං සංගහෙත්වා පවුච්චරෙ.

"යෙනාදි කීහු,,—සීමාලඞ්කාරකෙ. (සීමාලඞ්කාර ගණ්ඨියෙව අන්නාපද ලොපවසෙන සීමාලඞ්කාරොති වුච්චති, සීමාලඞ්කාරො එව

සීමාලඞ්කාරකො-නස්මිං) සීමාලඞ්කාර ගණ්ඨියෙහි; යෙ අත්ථා, ය ම් අර්ථකෙනෙක්; වුත්තා, විස්තරයෙන් කියන ලද්හුද; තෙ, ඒ අර් ථයෝ; ඉදානි, දැන්; මයා, මා විසින්; භික්ඛූනං, භික්ෂූන්ගේ; වාචු ග්ගතත්ථං, වාචොද්ගතය පිණිස; (වචනයෙන් පුහුණුකරණ පිණිස යයි සේයි;) සංගහෙත්වා, "ගාථායෙන්,, සංක්ෂෙපකොට; පවුච්චරෙ කියනු ලැබෙත්.

සංග්‍රහ නම්-විස්තාරයෙන් දක්වනලද අර්ථයන් "කැටිකොට;, ගැන්මයි. මෙම කීහු—"විස්තරෙණොපදිෂ්ටානාමර්ථානාං සූත්‍රභා ෂයොඃ, නිබන්ධොයඃ සමාසෙන සංග්‍රහං තද්විදුර්බුධාඃ,,යි—සීමාලං කාරයෙහි අර්ථයන් සංග්‍රහකොට කරණලද ගාථාබන්ධනයද සීමා ලඞ්කාර සංග්‍රහනම—සීමාලඞ්කාරො සංගය්හති එතෙනාති සීමා ලඞ්කාරසංගහො,—මෙහි සීමාලඞ්කාරකෙ යනාදියෙන් "නිශ්‍රයද,, සංගහෙත්වා-යන්නෙන් "කරණ ප්‍රකාරයද,,—භික්ඛූනං වාචුග්ගත ත්ථං-යන්නෙන් "ප්‍රයොජනයද,, සන්දර්ශිතයි.

"පච්ඡිමගෙනන,, යනාදි ගාථාත්‍රයෙන් වක්ෂ්‍යමාන ප්‍රකරණයා ගේ උද්ග්‍රහන ධාරණාදියෙහි යොදත්.

**3. පච්ඡිමගෙනන පඤ්චාපි යාවචනතානති භික්ඛවෙ, තාවචනතානි ලොකම්හි ලොකනාථස්ස සාසනං.**

පච්ඡිමගෙනන, හැමට යටත් පිරිසෙයින්; භික්ඛවෙ, භික්ෂූහු; පඤ්චාපි, පඤ්චවර්ගී වූවාහුද; ලොකම්හි, මනුෂ්‍ය ලොකයෙහි; යාවච නතානති, යම්තාක් කර්මයට යොග්‍යව පවතිද්ද; තාව, ඒතාක්; ලො කනාථස්ස, ලොකස්වාමිහුගේ; සාසනං, ප්‍රතිපත්ති ශාසනයහා ප්‍ර තිවෙධ ශාසනය; වත්තනති, ලොවැ පවතී.

"පඤ්චාපි,, යන තැන "අපි,, ශබ්දයෙන් දශවර්ගී, විංශති වර්ගී, අතිරෙක විංශතිවර්ගී, සඞ්ඝයා ඇති කල්හි යථොක්ත ශාසනයාගේ පැවැත්ම පළමුමැයි දක්වත්.

**4. නහොති භික්ඛුභාවො සො උපසම්පත්තියා විනා, නහොති උපසම්පත්ති සීමාසම්පත්තියා විනා.**

සො භික්ඛුභාවො, ඒ උපසම්පන්න භාවය තෙම; උපසම්පත්ති යා විනා, (සීමාසම්පත්ති, පරිසසම්පත්ති, පුග්ගලසම්පත්ති, ඤත්තිස ම්පත්ති, කම්මවාචාසම්පත්ති-යයි කියනලද පඤ්චවිධ) උපසම්පද ක ර්මසම්පත්තියෙන් තොරව; නහොති, නොවේ; උපසම්පත්ති, ඒ

උපසම්පත්තියද; සීමාසම්පත්තියා විනා, සීමාසම්පත්තියෙන් වෙන්ව; න හොති, නොවෙයි.

අතිඛුද්දිකාදී එකොළොස් විපත්ති දෝෂයෙන් විනිර්මුක්තව-නිමිත්ත සම්පත්‍යාදී ත්‍රිවිධ සම්පත්තියෙන් සමන්‍වාගමයයි කියනලද සීමාවගේ ගුණොත්කෘෂ්ට භාවයට පැමිණීම, "සීමාසම්පත්ති,, නම් වෙයි-"ගුණුක්කංසෙ ච විභවෙ සම්පත්තිවෙව සම්පද,, යනු "සම්පත්ති,, ශබ්දයෙහි නානාර්ථයි.

පරිස පුද්ගලාදී ඉතිරි සම්පත් සතරින් එකක් නැති කල්හිද උපසම්පත්තිය නොවෙයි, එසේකල උපසම්පත්තිය සීමාසම්පත්තියෙන් වෙන්ව නොවේයයි-කුමක් හෙයින් සීමාසම්පත්තියම වෙන් කොට කිවුදයත් ? මේ ප්‍රකරණයෙහි සීමාවිභාග දක්වන හෙයින් මෙතැනට අනුරූප කොට ප්‍රස්තාව වශයෙන් කීහු.

**5. තස්මා සා භික්ඛුනා සාධු විඤ්ඤාතබ්බා යතො සියා,
තස්මා සක්කච්ච තං සබ්බෙ නිසාමයථ සාධවො.**

තස්මා, (යම් හෙයකින් උපසම්පත්තිය සීමාසම්පත්තියෙන් වෙන්ව නොවේද) එහෙයින්; සා, ඒ සීමාසම්පත්ති තොමෝ; භික්ඛුනා, මහණ විසින්; යතො, යම් හෙයකින්; සාධු, මනාකොට; විඤ්ඤාතබ්බා සියා, දතයුතු වන්නීද; තස්මා, එහෙයින්; සබ්බෙ සාධවො, සියලු සාධුජනයෙනි ? තං, ඒ සීමාසම්පත්තිය; සක්කච්චං, සකස්කොට; නිසාමයථ, අසව්; (වාචොද්ගත කොට හෝ සිත්හි ධරව්) සලකව්.

"නි,, පූර්වසමධාතුහට චුරාදිගණයෙහි රූපයි, සමආලොචනෙ, සම චින්තනෙ, යනු හෝ ධාතුයි. මෙසේ රත්නත්‍රයට නමස්කාර හා නිශ්‍රය කාරණ ප්‍රකාර ප්‍රයොජනයන් දක්වා, තදනන්තරව "සක්කච්චං සවන ධාරණ පටිබද්ධාති සබ්බාපි සාසනසම්පත්ති,,-යු බැවින් තමන් විසින් වක්ෂ්‍යමාන සීමාසම්පත්තිගේ ශ්‍රවණ ධාරණාදියෙහි සාධුජනයන් යොදා, දූන් "සීමාලඞ්කාරකෙ,, යනාදි ගාථායෙන් දක්වනලද ප්‍රතිඥාවට අනුරූපකොට සීමාවන්ගේ ප්‍රභෙද ස්වරූප ප්‍රවෘත්ති නිමිත්තාදිය දක්වනු පිණිස,

"**සඞ්ඝකම්මාරහා සීමා**,, යනාදිය ප්‍රාරබ්ධයි. මෙතැන් පටන් සුබොධස්ථානයෙහි අවතාරිකා වාක්‍යහැර ඒ ඒ ගාථාවන්ගේ දූ

සෞධස්ථානයෙහි අභිප්‍රාය වචනාර්ථ පදවිභාග සහිතකොට "පදත්‍ථ,, දක්වනු ලැබේ.

6. සංඝකම්මාරහා සීමා බද්ධාබද්ධවසා ද්විධා,
තිධාබද්ධා තථාබද්ධා ඉති ඡධාව දීපිතා.

සංඝකම්මාරහා, උපසම්පදාදි සංඝකර්මයට යොග්‍යවූ; සීමා, සීමා තොමෝ; බද්ධාබද්ධවසා, බද්ධසීමා අබද්ධසීමා යන මොවුන්ගේ වශයෙන්; ද්විධා, දෙපරිද්දෙකින් වෙයි; (ඒ දෙදෙන අතුරෙහි,) බද්ධා, බද්ධසීමාතොමෝ; තිධා, තුන් පරිද්දෙකින් වෙයි; අබද්ධා, අබද්ධසීමාවද; තථා, එසේම තුන් පරිද්දෙකින් වෙයි; ඉති, මෙප්‍රකාරයෙන්; ඡධා එව, සපරිද්දෙකින්ම; දීපිතා, ප්‍රකාශකරනලද්දී.

ඇතම් ආචාර්‍ය්‍ය කෙනෙක් යථොක්ත බද්ධාබද්ධ ෂට්විධ සීමාවන් කොරෙන් වෙන්කොට නදී ජාතස්සර සමුද්‍රරණ්‍යයන්ගේද සීමාබව කියති, මේ ආචාර්‍ය්‍ය වනාහි ඔවුන්ගේ අසීමාබවම කල්පනාකොට ඒ හගවනු පිණිස "ඡධාව,, යන තන්හි "එව,, කාරය සුගත "එව,, සම්බුද්ධ: යනාදියෙහිමෙන් "අන්‍යයොග ව්‍යවච්ඡෙදක,, කොට කීහු.

7. ඛණ්ඩසමානසංවාසා විප්පවාසවහයාදිමා,
පරාගාමොදකුක්ඛෙප සත්තබ්භන්තරනාමිකා.

ආදිමා, පලමුකොට කියනලද බද්ධසීමා තොමෝ; බද්ධ සමාන සංවාසා විප්පවාසවහයා, බද්ධසීමා සමානසංවාසසීමා අවිප්පවාස සීමාය යන නම් ඇත්තීය; පරා, අබද්ධසීමා තොමෝ; ගාමොදකුක්ඛෙප සත්තබ්භන්තරනාමිකා, ගාම සීමාය උදකුක්ඛෙප සීමාය සත්තබ්භන්තර සීමාය යන නම් ඇත්තීවෙයි.

ආදිමහි භවා "ආදිමා,,-ප්‍රත්‍යයන් තමන් නානාර්ථ බැවින් ආදිමහි වූතතා "ආදිමා,,-සි උක්තාර්ථයෙහි හෝ "ඉම,, ප්‍රත්‍යයවූ තැනි.

8. යාසීමන්තරිකාසාහි පරිවජ්ජිත්වාසමන්තතො,
ඛණ්ඩසීමානිසාවුත්තා පරිතොබද්ධිතායතො.

යා, (ඒ බද්ධසීමාදීන් අතුරෙහි) යම් සීමාවක්තොමෝ; සමන්තතො, හාත්පස්හි; සීමන්තරිකාය, (සීමාච සීමාච සීමා, සරූපෙකසෙසොයං, සීමානං උභින්නං බද්ධසීමානං අන්තරෙ මජ්ඣෙ භවා සීමන්තරිකා-සීමන්තරිකානම් බද්ධසීමාවන් දෙදෙනා අතුරෙහි ම

මුන් දෙදෙනාගේ වෙන් කිරීම පිණිස තබනලද යටත් පිරිසෙයින් සතරඟුල් පමණවූද ග්‍රාමසීමාවට අයත් භූමිප්‍රදේශයයි) ඒ සීමන්තරිකාවෙන්; පරිවජ්ජිතත්තා ආසි, පිරිසුන්විද; සා, ඕතොමෝ; යතො, යම් හෙයකින්; පරිතො, හාත්පස්හි; ඛණ්ඩතා, අන්‍යබද්ධසීමාවන්හා මිශ්‍රනොවන බැවින්) පරිවජ්ජිතාවීද; (“යත්තත්,, ශබ්දදෙදෙන නිත්‍යසම්බන්ධ හෙයින් “තතො,,යි-නොකීවද, “යතො,, යන්නෙන්ම හැඟෙයි. “තතො,, එහෙයින්,) ඛණ්ඩ සීමාති, ඛණ්ඩ සීමා යයි; වුත්තා, කියනලදු.

මෙසින් ඛණ්ඩිතාසීමා ඛණ්ඩ සීමා-යනු සිඬයි, “ඛණ්ඩසීමාති,, ක්ෂුද්‍රකසීමා-යනු විනයාර්ථමඤ්ජුෂායි, ප්‍රව්‍රජ්‍යා උපසම්පදාදි සංඝකර්මයන් සුවසේ කරණ පිණිස මහාසීමාවතුල සම්මතව තුබූ යටත් පිරිසෙයින් එක්විසි නමකගේ පරිමඩලා කාරයෙන් ඉඳීමට පොහොනා කැබලි සීමාවන්ට මහාසීමාව අපෙක්ෂාකොට කුඩාසීමායයි කියත්.

9. වුත්තාසමානසංවාසා සීමන්තරිකතොබහි,
ජාතස්සරනදීසින්ධු බද්ධසීමාහිවජ්ජිතෙ.

10. භූමිපබ්බතපාසාණ පිට්ඨාදිසම්නතුසම්මතා,
ගාමෙරඤ්ඤපදෙසෙවා මිස්සෙවා විහිතෙහිපි.

11. සීමාතියොජනුක්කංසා මහාසීමාතිසම්මතා,
බහිඬාසන්නසීමානං සීමන්තරිකනිස්සයා.

සීමන්තරිකතො බහි, (ඛණ්ඩසීමාවගේ) සීමන්තරිකාවෙන් පිටත්හිවූ; ජාතස්සර, ස්වයංජාත විල්ය; නදී, ගඟාය; සින්ධු, සමුද්‍රය; බද්ධසීමාහි, අන්‍ය බද්ධසීමාය යන මොවුන් කෙරෙන්; වජ්ජිතෙ, තොරවූ; භූමි, පොළොවය; පබ්බත, පර්වතය; පාසාණ පිට්ඨාදිසම්නතු, පිටිපහන්ය යනාදීවූ; (“තු,, ශබ්ද පදපූරණයෙහිය,) ගාමෙවා, ගම්පෙදෙස හෝ; (මෙයින් නිගම, නගරයෝද ගන්හු,) අරඤ්ඤපදෙසෙ වා, අරන් පෙදෙස හෝ; තෙහි වීහිපි මිස්සෙවා, ඒ දෙකින්ම මුසු පෙදෙස හෝ; සම්මතා, (උපොසථක්ඛන්ධකයෙහි වදාළ සීමාසම්මුති කර්මවාක්‍යයෙන්) බඳනාලද; තියොජනුක්කංසා, (තිණ්ණං යොජනානං සමාහාරො තියොජනං,-තං උක්කංසො, උක්කට්ඨප්පමාණො අස්සාති තියොජනුක්කංසා—) තුන් යොදන උත්කෘෂ්ට පරිච්ඡේදකොට ඇති; (සීමාව මධ්‍යයෙහි සිටියහට තමා සිටි තැන් පටන් සිවුදිගින් එකිඑකී දික්හි සීමාව ඔබකෙළවරට යෙළ

සෙල යොදුන් වේද, එසේ ප්‍රමාණකරණලද තුන් යොදනට වැඩි නොවූ යන අභිප්‍රායයි,) බහිධාසන්න සීමානං, පිටසිටි සමීප බඩසීමාවන්ගේ; සීමන්තරිකතිස්සටා, සීමන්තරිකාවෙන් විනිර්මුක්තවූ පහවූ; (“නි,, පූර්‍ව සරගතිමනි යන ධාතුයි,) මහාසීමාති සම්මතා, මහාසීමායයි සම්මතවූ; සීමා, යම් සීමාවෙක් ඇද්ද ඕතොමෝ; සමානසංවාසා වුච්චති, සමානසංවාස සීමායයි කියනලදු.

“ඉති,, ශබ්ද ලුප්ත නිර්දෘෂටයි, “සීමන්තරිකතො බහි,, යන තන්හි සීමන්තරිකාවෙන් පිටත්හියයි සත්තම්‍යන්ත කොට හෝ “සම්මතා,, යනු හා යෙදියයුතු, ජාතස්සරොච නදීච සිඤ්ඣුච බඩසීමා ච ජාතස්සර නදී සිඤ්ඣු බඩසීමායො-තාහි, “ජාතස්සර,, ග්‍රහණයෙන් ගෙබ්ද, “නදී,, ග්‍රහණයෙන් මහාමාතෘකාද, “සිඤ්ඣු,, ග්‍රහණයෙන් කලපුද ගන්නාලදහ,

භූමිච පබ්බතොච පාසාණපිඨිච භූමි පබ්බත පාසාන පිටඨයො– තෙ ආදී යස්ස පදෙසස්ස සො භූමිපබ්බත පාසාණ පිටඨාදි—තස්මිං. දෙතැන්හිම ප්‍රථමා බහුවචනාන්ත කොට හෝ වාක්‍යගතයුතු, “පිඨාදිස්මිං,, යන තන්හි “ආදි,, ශබ්දයෙන් පාසාණ කුටි ලෙණාදිය ගන්නු.

“විමුත්තිඤාණප්පභූතීහි යුතෙනා,, යනාදියෙහි මෙන් “පාසාණාච පාසාණපිඨිච,, යී, කිච්චමනා තන්හි සරූපෛක ශෙෂවශයෙන් “පාසාණ පිටඨාදිස්මිං,, යී කියනලද්දයි හෝ දතයුතු. “සීමන්තරිකතො බහි ජාතස්සර—පෙ—වජ්ජිතෙ, බහිධා—පෙ—තිස්සටා,, යන මෙයින් සමානසංවාසක සීමා බන්ධනයට නුසුදුසු තැන් දක්වත්, භූමි පර්තාදීහු වනාහී සුදුසු තැනී.

### 12. චීවරාවිප්පවාසාය බඩසීමාවසම්මතා, සොපචාරංවිනාගාමං විප්පවාසාති දීපිතා.

සොපචාරං, උපචාර සහිතවූ; ගාමං විනා, ගමහැර; (ගාමො පචාරොනාම=පරික්ඛිත්තස්ස පරික්ඛෙපො අපරික්ඛිත්තස්ස පරික්ඛෙපාරහටඨානං‘යී-කියනලද,) චීවරාවිප්පවාසාය, තුන්සිව්රෙන් වියෝ නොවීම පිණිස; සම්මතා, අවිප්පවාස කම්මවදනින් සම්මුති කරණලද; බඩසීමා එව, යථොක්ත බඩසීමාවම; අවිප්පවාසාති දීපිතා, අවිප්පවාස සීමාවයයි ප්‍රකාශකරණලදු.

දුතිය කඨින ශික්ෂාපදයෙහි වදල ක්‍රමයෙන් සිවුරුනාමින් ඉදු තුන්සිවුරු අතරෙන් එක්තරා සිවුරක් සම්මුති නොලද මහණෙක් අත්පසින් වෙන්කොට අරුණක් නැගුව ඒ සිවුර නිසගිවෙයි. ගාම ගාමොපචාරයන් තබා අවිප්පවාස සීමාවෙහි එසේකල නිසගි නොවෙයි, හුදෙක් මේ මතු නොවෙයි, සමානසංවාසක සීමාවගේ දෘඪබවද වෙයි; මේ අවිප්පවාස කම්වදනෙහි ප්‍රයොජනයි, "විනාගාමං විප්පවාසා,, යන තන්හි අනුස්වාරයා කෙරෙන් පරස්වර ලොපයි,

**13. ගාමාදීනංකරගාහ පරිවජ්ජිතො සමන්තතො,**
**පදෙසො ගාමසීමාති අබද්ධා සංපකාසිතා.**

ගාමාදීනං, ග්‍රාම නිගම නගරාදීන්ගේ; (යම් ප්‍රදෙශයෙක්හි ප්‍රාකාර පරික්ෂෙප රහිතව ආපණයෝම පමණක්වූද, නොහොත්-ආපණරහිතව ප්‍රාකාර පරික්ෂෙප මාත්‍රවේද ඒ "ග්‍රාම,, නම්වෙයි, යම්තැනෙක්හි ප්‍රාකාරාපණ විරහිතව ගෘහමාත්‍රයක් ඇත්තේද ඒ "නිගම,, නම්වේ, ප්‍රාකාර පරික්ෂෙපයෙන් හා ආපණයෙන්ද යුක්තවූ ප්‍රදෙශය "නගර,, නම් වෙයි—"විචිත්‍ර දෙවායතන ප්‍රාසාදපණ්‍යමන්දිරම් නාගරං දශීසෙව්වාන් රාජමාගෝප ශොභිතම්,,-යනු ලෞකිකයන්ගේ "නගර,, ලක්ෂණයි) සමන්තතො, හාත්පස්හී; කරගාහ පරිවජ්ජිතො, අයබදු ගැන්මෙන් පිරිසිඳිනලද; පදෙසො, "අත්ථි,, යම් ප්‍රදෙශයෙක් ඇද්ද; (නාමපදෙ වුත්තෙ අප්පයුත්තානිපි "අත්ථිහොති විජ්ජති,,ති-එවරූපානි කිරියාපදානි ආනෙත්වා සම්බන්ධිතබ්බානි, යනු න්‍යායහෙයින් ස්වරූපයෙන් නොකීයන ලදද "අත්ථි,, යන්නක් යොජනයි) අබද්ධා, කර්මවාක්‍යයෙන් අසම්මතවූ; අයං, මෝතොමෝ; ගාමසීමාති පකාසිතා, ගාමසීමායයි ප්‍රකාශ කරණලදී.

**14. අගාමකෙඅරඤ්ඤස්මිං සත්තබ්භන්තරසම්මතා,**
**සීමාසමන්තතොයන්තු සත්තබ්භන්තරසඤ්ඤිතා.**

අගාමකෙ, (එකදවසින් ගොස් ඉයනොහැකි බැවින්) ග්‍රාමක්ෂෙත්‍ර විරහිතවූ; (මෙතන "අකාර,, විරහාර්ථයි, ගාමො එව ගාමකො-ගාමකෙන ගාමකෙඛත්තෙන විරහිතො අගාමකො-තස්මිං,) අරඤ්ඤස්මිං, අරණ්‍යයෙහි; (අගාමකංනාමඅරඤ්ඤං, විංඣාටවි ආදිසුවා සමුද්දමජ්ඣෙවා මච්ඡබන්ධානං අගමනපථෙ දීපකෙසු ලබ්භති, යනු අටුවායි,) සමන්තතො, (භික්ෂූන් සිටි අවකාශයෙහි පටන්) හාත්පස්හී; සත්තබ්භන්තර සම්මතා, සත්අබතුරෙන් සම්මතවූ; සීමා, යම්සීමාවෙක් ඇද්ද; අයන්තු, මෝතොමෝ; සත්තබ්භන්තර සඤ්ඤිතා, සත්තබ්භන්තර සීමායයි සංඥාකරණලදු.

මෙහි අබ්භන්තර පරිච්ඡේදය නම්=භික්ෂූහු සිටිතැන් පටන් නැගෙණහිරට සත් අබතුරෙක්ය, දකුණ බටහිර උතුරටත් එසේම වෙයි. "විනිබ්බෙධෙන චුද්දසහොනාති,, යනු අටුවා බැවින් සීමාවගේ නැගෙණහිර කෙළවර පටන් බටහිර කෙළවර දක්වා තුදුස් අබතුරුය, දකුණපටන් උතුරටත් මෙසේමය. අවට අබතුරු දෙසාළිසෙකි, අබතුරෙක් නම්=ප්‍රමාණ මධ්‍යම් පුරුෂයාගේ රියනින් අටවිසි රියනෙක් වේ.

**15. අනෙකානජ්ජාසමුද්දස්ස තථා ජාතස්සරස්සච,**
**මජ්ඣිමස්සොදකුක්ඛෙපා පරිවජ්ජිත්වාසමන්තතො;**
**උදකුක්ඛෙපසීමාති අබද්ධායං පදීපිතා.**

"අනෙකානජ්ජා,, යන තන්හි "අනෙකා,, ශබ්දයද, "ජාතස්සරස්සච,, යන තන්හි "ච,, ශබ්දයද, අධිකාර වශයෙන් ඉතුරු දෙතන්හිද යොදනු.

නජ්ජා අනෙකාව, ලක්ෂණප්‍රාප්ත නදියගේ ඇතුල්හිද; තථා, එසේම; සමුද්දස්ස අනෙකාව, සමුද්‍රය ඇතුලෙහිද; ජාතස්සරස්ස අනෙකාව, ලක්ෂණප්‍රාප්ත ජාතස්සරයාගේ ඇතුල්හිද; මජ්ඣිමස්ස, බලමැදුම් "පුරුෂ,,යාගේ; ("ගම්‍යමානත්ථස්ස සද්දස්ස පයොගංපති කාමාචාර,, යනු න්‍යායයහෙයින් "පුරුෂ,, ශබ්දයාගේ ගම්‍යමානහෙයින් අප්‍රයොගයි) උදකුක්ඛෙපා, උදකුක්ඛෙපප්‍රමාණ යෙන්; (කරණාර්ථයෙහි "අවධි,, විභක්තියි) සමන්තතො, හාත්පස්හි; පරිවජ්ජිත්වා, පිරිසුන්වූ යම් සීමාවෙක් ඇද්ද; අබද්ධාඅයං, අබද්ධවූ මෝතොමෝ; උදකුක්ඛෙපසීමාති පදීපිතා, උදකුක්ඛෙප සීමායයි ප්‍රකාශකරණලදු.

උදකුක්ඛෙපයෙක් නම්=මධ්‍යම පුරුෂයාගේ රියනින් සතරරියන් ප්‍රමාණඇත්තේයයි කියත්, නදී ජාතස්සරයන්ගේ ලක්ෂණප්‍රාප්ත වන නොවන බැව් මෙසේය, යම් ගඟාවෙක්හී අඹිඹිමාසයෙහි අනුද්දසාහයෙහි අනුප්‍රවාහයෙහි වැසිවස්නා කල්හී වලාවපහවූ ඇසිල්ලෙහිම ජලප්‍රවාහය සිඳීයේනම් මෝතොමෝ නදී ව්‍යවහාරයට නොයෙයි, අඩමසින් අඩමසහෝ දසදවසින් දසදවසහෝ පස්දවසින් පස්දවසහෝ යම්ගඟෙක මෙබඳු වැසිකල්හී(වසන්සාරමස්හී)ප්‍රවාහය නොසිඳීපවතීද; යම්ගඟෙක තොටින්හෝ නොතොටින්හෝ බැස සෙඛියායෙහි වදළ ක්‍රමයෙන් තෙමඹුළුවසා හැඳ අන්තරවාසකය නොනගා

එතරවන මෙහෙනියගේ අඳනාසිවුර අඟලක්හෝ දෙයඟලක් හෝ තෙමියේද මෝතොමෝ සමුද්‍රයට හෝ තලාකයට හෝ බසීවා උත්පත්තියෙහි පටන් නදීනම්වේ, මේ යටත්පිරිසෙයයි.

යම්කිසි සූකරාදී තිරිසනෙක් විසිනුදු නොකරණලද එහෙයින් ස්වයංජාතවූව ආවාටයෙක් යථොක්ත සමවර්ෂාකාලයෙහි දියෙන් පිරිසිටිද ඒ ජාතස්සරය ලක්ෂණ ප්‍රාප්තනම්.

16. සීමාතිකොජ්ඣුක්කට්ඨා බද්ධසීමාසුපච්ඡිමා,
එකවීසතිභික්ඛූනං නිසජ්ජායපහොණකා.

බද්ධසීමාසු; බද්ධසීමාවන් අතුරෙහි; උක්කට්ඨා, උත්කෘෂ්ටවූ; සීමා, සීමාතොමෝ; තියොජනා, තුන්යොදුන් ඇත්තීය; පච්ඡිමා, පච්ඡිම සීමාතොමෝ; එකවීසති භික්ඛූනං, (සංඝකර්මයෙක් නම් විංශතිවර්ගකර්මය පරමකොට ඇති බැවින් කර්මාර්හයා සමග) සිල්වත්භික්ෂූන් එක්විසිදෙනෙකුගේ; නිසජ්ජාය, පරිමඩලාකාරයෙන් හිඳීමට; පහොණකා, පොහොණා ප්‍රමාණඇතිවෙයි.

17. ගාමසීමායඋක්කට්ඨො ඔමකොවානදීපිතො,
පරිච්ඡෙදො යථාලද්ධපමාණායෙව සාසියා.

ගාමසීමාය, ගාමසීමාවගේ; උක්කට්ඨොවා, උත්කෘෂ්ටවූ හෝ ඔමකොවා, අධමවූ හෝ; පරිච්ඡෙදො, ප්‍රමාණයෙක්; නදීපිතො, පෙළඅටුවාෙයෙහි නොකියනලදී; (කවරහෙයකින්දයත්,) සා, ඒ ගාමසීමාතොම; යථාලද්ධපපමාණා එව සියා, ලද්ලද් ප්‍රමාණ ඇත්තීම සීමාවේද එහෙයිනි.

මෙතන “යථා,, ශබ්ද “යථා,, බුඩ්ඪං යනාදීශෙහිමෙන් වීප්සායෙහි වැටේ, යංයංලද්ධං යථාලද්ධං,-යථාලද්ධං පමාණං අස්සාති යථාලද්ධපපමාණා,-දෙලොස් යොදුන් ආදි ප්‍රමාණඇති බරණැස්නුවර ආදීන්ගේ මහාපරිච්ඡෙදයද, කුඩාවූ බිබුල්හා වැලිරැස් පමණක් ඇති දූපත් ආදියෙහි එකද මහණක්හුගේ ඉටන්පොහොයට පොහොණා කුඩාගම්කෙතද ග්‍රාමසීමා වන බැවින් මේ ග්‍රාමසීමායෙහි උත්කෘෂ්ට ඔමක පරිච්ඡෙදයෙක් පෙළ අටුවායෙහි නොආයේය යනු ගාථායෙහි තාත්පර්‍ය්‍යාර්ථයි.

18. දස්සිතොලුද්දකුක්ඛෙපො සත්තබ්භන්තරසඤ්ඤිතං,
උක්කට්ඨොවපරිච්ඡෙදො නොමකොපනදස්සිතො.

උදකුක්ඛෙප සත්තබ්භන්තර සඤ්ඤීනං, උදකුක්ඛෙප සත්තබ්භ න්තරනම් ඇති සීමාවන්දෙදෙනාගේ; උක්කට්ඨවච පරිච්ඡෙදො, උත්කෘෂ්ටවූම පරිච්ඡේදය; දිස්සිතො, දක්වනලද්දේය; ඔමකොපන, ඔමක පරිච්ඡෙදය වනාහි; නදිස්සිතො, නොදක්වන ලද්දේය; (කු මක්හෙයින්දයත්).

**19. යථාවුත්තපමාණාපි වට්ටන්තූනාපිතායතො,**
**අතිරෙකා නලබ්භන්ති සකෙ ඛෙත්තෙතිවෙදියා.**

තා, ඒ උදකුක්ඛෙප සත්තබ්භන්තර සීමාවෝ දෙදෙන; යථාවු ත්තපමාණාපි (මැදුම් පිරිමිහුගේ උදකොක්ෂෙපයයි කියනලද ස තරරියන් ප්‍රමාණයද ඔහුගේම සතරරියන් දුන්නෙන් දුනුසතෙක් වූ සත්අබතුරුප්‍රමාණයදයි කියනලද) යථොක්ත ප්‍රමාණ ඇත්තාහු ද; ඌනාපි, එයින් උනුවූවාහුද; යතොවට්ටන්ති, යම්හෙයකින් ව පිද්ද එහෙයින්; සකෙඛෙත්තෙ, (නදීජාතස්සර සමුද්‍ර අගාමකාරඤ්ඤ යයි කියනලද) තමතමන්ගේ ක්ෂෙත්‍රයෙහි; අතිරෙකා, යථොක්ත ප්‍රමාණයෙන් අධිකවූ ප්‍රමාණ ඇත්තාහු; නලබ්භන්ති, නොලැබෙ ත්යයි; වෙදියා, දතයුක්තාහුයි.

මෙහි අභිප්‍රාය සීමාලඞ්කාරසංග්‍රහ වර්ණනායෙහි ඡප්පට්ඨාචාර්‍ය්‍ය යන් විසින් මෙසේ කියනලදී. අයංපනෙත්ථ අධිප්පායො, මච්ඡබන්ධ නාදීනං අගමනපථභූතෙ සමුද්දමජ්ඣෙ උදකෙන අනජ්ඣොත්ථට පාසාණපිට්ඨිආදි ඛුද්දකදීපෙ සමන්තතො සත්තබ්භන්තරං අප්පහො න්තොපි සත්තබ්භන්තර සීමානාමහොති, ලක්ඛණප්පත්ත ජාතස්ස රාදිසු සංඝගණපුග්ගලෙහි සමාකිණ්ණෙසු මජ්ඣිමථාමස්සුදකුක්ඛෙ පා පහොන්තෙසුපි තතොබහි සමන්තතො විදත්ථිරතනාදිප්පමාණයු ත්තානං ජාතස්සරාදීනං අබ්භන්තරං උදකුක්ඛෙපසීමානාම හොති'යි.

මසුන්බැඳීම්ආ ඒ ඒ ක්‍රියාපිණිස යන්නවුන්ට තමන්ගේ ගම් වලට දුරුබැවින් එකදවසින් ගමනාගමනය නොකොට හැකි මුහුදු මැද දියනොගලන ලදුව සිටි පිටිපහන් ආදි කුඩා ද්වීපයෙක් ඇද්ද හෙතෙම උඩත්පිරිසෙයින් වදල සත්තබ්භන්තරසීමාවට නොපො හොනේනමුදු කුඩාඅබතුරු සීමානම්වෙයි, සංඝගණ පුද්ගලයන් ගෙන් මනාකොට ගැවසෙනලද ලක්ෂණප්‍රාප්ත ජාතස්සරාදිය සංඝා දීන්ගේ ගැවසීම හෙතුකොටගෙණ බලමැදුම් පුරුෂයාගේ උදකු ක්ඛෙපප්‍රමාණයට නොපොහොනේනමුදු ඒ සංඝාදීන් සිටිතැන්පට

ත් පිටත්හි හත්පසැත්සිටි වියත් රියන් ආදි ප්‍රමාණයෙන් යුත් ජාතස්සරාදීන්ගේ අබතුර උදකුක්ඛෙපසීමා නම්වෙයි යන අර්ථයි.

ඇතැම් කෙනෙක්-ලක්ඛණපපහතජාතස්සරාදිසු යනාදි පාඨයෙහි "සමාකිණ්ණෙසු,, යනතන්හි "පැමිණෙනලද,,යයි ප්‍රාප්ත්‍යර්ථයෙක්ද "සංඝගණපුග්ගලෙහි,, යන්නෙහි සංඝයා විසින් හෝ ගණයා විසින්හෝ පුද්ගලයා විසින්හෝ යයි "විකල්පාර්ථයක්ද කල්පනාකොට, යම් කුඩාවූ ජාතස්සරයකට උපොසථාදී චතුර්ගීකර්මයක් පිණිස භික්ෂූහු සතරනමක් පැමිණිකල්හී ඒ ජාතස්සරය ප්‍රකෘතියෙන්ම කුඩාවූ බැවින් බලමැදුම් පිරිමිහුගේ උදකුක්ඛෙපප්‍රමාණයට නොපොහොනේද ඔවුන් සිටිතැන් පටන් පිටත හාත්පස්හි වියතක් හෝ රියනක් හෝ ඇත්නම් එද උදකුක්ඛෙපසීමාවෙයි, මහා ජාතස්සරයෙක්හි නමුදු භික්ෂුසංඝයාගේ පැමිණීමෙන් මෙසේවූව උදකුක්ඛෙපසීමාමවෙයි. මේනය ගණපුද්ගලයන්ටත් යථායොගයෙන් යෙදියයුතුය. මේ අර්ථයතකා ලක්ඛණපපහතයනාදී පාඨය කියනලදැයි කියත්.

හේ ඔවුන්ගේ අසතනොමනීමාත්‍රයෙකි, "සමාකිණ්ණෙසු,, යනතන්හී "සං,, යන උපසර්ග ශබ්දයෙන් වෙසෙසනලද අර්ථ ඇති "ආකිණ්ණ,, ශබ්දයයි. මේ ආකිණ්ණශබ්දය නම් නොයෙක් පාළිප්‍රදේශවල හා අටුවාටීකාදියෙහිද- "ආකිණ්ණමනුස්සං,, "ආකිණ්ණලුද්දො පුරිසො,, "කසෙසතමාකිණ්ණජනංවිමානං,, යනාදීන් මේ ආකිණ්ණ ශබ්දයාගේ ගැවසිම් අර්ථය ප්‍රකාශකබවමුත් ප්‍රාප්ත්‍යර්ථ වාචකබවෙක් නොපෙණෙයි. "සංකිණ්ණාකිණ්ණසංකුලා,,යි පාළිනිඝණ්ඩුයෙහිද-"සංකීර්ණේ සංකුලාකීර්ණේ,,යි—අමරකොෂයෙහිද, මිටම පර්යාය දක්වනලද, එහෙයින් ඔවුන්ගේ ඒ වචනය අසාරමැයි.

සංඝගණපුග්ගලෙහි යන්නෙහිද-සංඝාච ගණාච පුග්ගලාච-යි බහුවචන වශයෙන් හෝ ව්‍යාමිශ්‍රවහෝ වාක්‍යගෙණ "චාර්ථ,, සමාසකිරීමමුත් "වාර්ථ,, සමාසයෙක් ශබ්දලක්ෂණයෙහි නැති බැවින් ඒ ආයුෂ්මතුන් විසින් අභිප්‍රෙත විකල්පාර්ථයද මෙහි නොයෙදෙයි.

මෙසෙසින් උදකුක්ඛෙප සීමාවගේ කුඩාවීමයයි කියනලද කාර්යසිද්ධියට උපකාරවූ සංඝාදීන් අතුරෙන් එකක්හුගේ පැමිණීමයයි කියනලද ජනකහෙතුව මේපාඨයෙහි නොආබව හැඟෙන හෙයින්ද, ආගමනෙහිද නදීආදි ප්‍රදේශයෙහි සංඝගණපුද්ගලයෝ වෙන්වෙන්

ව ඒ ඒ කර්‍ම කරණබැව් දක්වා තිබෙන හෙයින්ද, ලක්ඛණපපත්තා දි පාඨය අපවිසින් කියනලද අභිප්‍රාය ඇත්තේයයි දතයුතු.

**20. තස්මා සකෙසකෙඛෙත්තෙ ඛුද්දකෙ අපිතාදුවෙ,**
**ලබ්භන්තෙකස්සභික්ඛුස්සා ධිට්ඨානොපොසථාරහෙ.**

තස්මා, යථොක්තප්‍රමාණයෙන් ඌණවද ලැබෙන හෙයින්; තා දුවෙ, උදකුක්ඛෙප සත්තබ්භන්තර සංඛ්‍යාත ඒ දෙසීමාවෝ; එකස්ස භික්ඛුස්සඅධිඨානොපොසථාරහෙ, එක්මහණක්හුගේ ඉටන්පොහො යට සුදුසුවූ; ඛුද්දකෙ, ක්ෂුද්‍රවූ; (ඒ ක්ෂුද්‍රභාවයදැම්, ප්‍රකෘතියෙන් හෝ සංඝාදීන්ගේ ගැවසීමෙන් හෝ වෙසි) සකෙසකෙඛෙත්තෙ, ජාතස්සරාදීනමතමන්ගේ ක්ෂෙත්‍රයෙහි; ලබ්භන්ති, ලැබෙත්.

දූත් බඩසීමායෙහි විපත්තිලක්ෂණ දක්වා, කර්මාභීබව දක්වන පිණිස "**එකාදස**,, යනාදිය කීහු.

**21. එකාදසවිපත්තීනං යායමඤ්ඤතරායපි,**
**සීමාවිපත්තියාමුත්තා තිසම්පත්තීහි සංයුතා.**

**22. රුක්ඛසාඛාදිනාඤ්ඤාහි සීමාහිපි අසංකරා,**
**බඩසීමාහිසාසබ්බ සඞ්ඝකම්මාරහාමතා.**

සා අයං සීමා, යම් මේ බඩසීමාවක් තොමෝ; එකාදසවිපත්තී නං, අතිඛුද්දිකාදි එකොළොස් විපත්තීන් අතුරෙන්; අඤ්ඤතරාය පි විපත්තියා මුත්තා, එක්තරාද විපත්තියකින් මිදුනී නැතිව සියලු සීමාවිපත්ති දොෂයෙන් මිදුනීද; තිසම්පත්තීහි සංයුතා, නිමිත්තස මපත්‍යාදි ත්‍රිවිධ සම්පත්තියෙන් යුතුද. රුක්ඛසාඛාදිනා, යම්කිසි වෘක්ෂ ශාඛා ධජපටාක ලතාදියකින්; අඤ්ඤාහිසීමාහිපි, අනික් සීමාවන්හාද; බඩසීමාහිපි, බඩසීමාවන්හාද; අසංකරා, නුමුසුවීද; සා, ඒ සීමාතොමෝ; සබ්බසඞ්ඝකම්මාරහා, සියළු සඞ්ඝකර්මයන්ට යොග්‍යයයි; මතා, දන්නාලදු.

එකොළොස් විපත්තිසීමා නම්=අති ඛුද්දිකංසීමං සම්මනන්ති, අතිමහතිංසීමං සම්මනන්ති, ඛඩනිමිත්තංසීමං සම්මනන්ති, ඡායානිමිත්තං සීමං සම්මනන්ති, අනිමිත්තං සීමං සම්මනන්ති, බහි සීමෙසිතො සීමං සම්මනන්ති, නදියාසීමං සම්මනන්ති, සමුද්දෙසීමං සම්මනන්ති, ජාතස්සරෙ සීමං සම්මනන්ති, සීමායසීමං සම්භින්දන්ති, සීමා

යසීමං අජ්ඣොත්ථරති, යනු වදාළ බැවින්, "අතිඛුද්දිකා—පෙ—සීමායසීමං අජ්ඣොත්ථරන්තෙන සම්මතා,, යන එකොළොසයි.

එහි "අතිඛුද්දිකා,, නම්=එක්විසිනමකගේ හිඳීමට නොපොහොනා සීමාවය "අතිමහතී,, නම්= තුන්යොජනටවඩා කෙසගක් පමණකිනුදු මහත්වූ සීමාවය- "ඛණ්ඩනිමිත්තා,, නම්=නොගලපන ලද නිමිත් ඇත්තීය, ("පුරත්ථිමායදිසාය කිංනිමිත්තං පාසාණො භන්තෙ එසොපාසාණො නිමිත්තං,,යි—නැගෙනහිරදිග නිමිත්ත කිත්තනයකොට පිළිවෙලින් දක්ෂිණ පශ්චිමෝත්තර තුන්දිසාවෙහිද කිත්තනයකොට එයින් නොනැවත නැගෙණහිරදිග පළමු කීර්තනයකළ නිමිත්ත නැවතත් කීර්තනයකොට නවත්වන්ට වුවී. එසේකල "අඛණ්ඩ,, නිමිත්තා නම්වෙයි, එසේ නොකොට උත්තරාය දිසාය කිං නිමිත්තං යනාදීන් උතුරුදිග නිමිත්ත කීර්තනයකොට එයින් නවතීනම් "ඛණ්ඩ,,නිමිත්තා නම්වෙයි, "ඛණ්ඩනිමිත්තා,, යන අර්ථයි නිමිත්තයට නුසුදුසු තල්පොල් ඈ රුකක්හෝ කණු පස්රැස් ආදීන් අතුරෙන් එකක්හෝ නිමිත්කොට සම්මතසීමාද "ඛණ්ඩනිමිත්තා,, නම) "ඡායානිමිත්තා,, නම්=පර්වතච්ඡායාදි යම්කිසි ඡායාවක් නිමිත්කොට බඳනාලද්දීය, "අනිමිත්තා,, නම්=සර්වප්‍රකාරයෙන් නිමිත්ත කීර්තනය නොකරණලද්දීය, "බහිසීමෙ ඨිතසම්මතා,, නම්= නිමිති කීර්තනයකොට නිමිතිවලට පිටසිටියහු විසින් සම්මතසීමාය, "නදියා සමුද්දෙ ජාතස්සරෙ සම්මතා,, නම්=මේ නදී ආදියෙහි සම්මතතුන්සීමාය, "සීමාය සීමං සම්භින්දන්තෙන සම්මතා,, නම්= තමන්ගේ බඩසීමාවෙන් මෙරමාගේ බඩසීමාව මුසුකරන්නහුවිසින් හෙවත් මෙරමාගේ සීමාවෙන් කෙශාග්‍රමාත්‍රයෙහි පටන් සතර නමකට නොපොහොනා ප්‍රදෙශය දක්වා තමන්ගේ සීමාවට ඇතුල් කොට සම්මතසීමාවය, "සීමාය සීමං අජ්ඣොත්ථරන්තෙන සම්මතා,, නම්=තමන්ගේ බඩසීමාවෙන් අනුන්ගේ බඩසීමාව මර්දනය කරන්නහු විසින් හෙවත් අනුන්ගේ බඩසීමාව සියල්ලම හෝ ඇගේ එකප්‍රදෙශයක් හෝ තමන්ගේ සීමාවට ඇතුල්කොට බඳනාලද්දීයි. (මෙපමණක් නොවෙයි, උපොසථක්ඛන්ධකයෙහිදී සීමාසම්භෙද අජ්ඣොත්ථරණ දෙෂයන් ප්‍රතිඤෙප කොට "අනුජානාමි භික්ඛවෙ සීමංසම්මන්නන්තෙන සීමන්තරිකං ඨපෙත්වා සීමංසම්මන්නිතුං,,යි බඩසීමාවන් දෙදෙනා අතුරෙහි සීමන්තරිකාතබාම බඳින්ට අනුදැනවදාළ සික්ඛාපදයෙන් බඩසීමාවෝ දෙදෙන ඔවුනොවුන් ස්පර්ශකොට සිටීම්වශයෙන් බන්ධනයද විපත්තිදෙෂයෙක් වෙයි-යනු සිඩයි.) මේසම්භෙද අජ්ඣොත්ථරණසංකරදොෂය ප්‍රතික්ෂෙපකරණ බුද්ධ

විසින් එක උපචාරසීමාවක්තුල අවකාශවූ පරිද්දෙන් සීමාබැඳගැන්ම අනුදූත වදාරණලද්දේම වේ.

“තිසම්පත්තිහිසංයුතා,, යන තන්හි. **ත්‍රිවිධසම්පත්තිනම්**=නිමිත්තසම්පත්ති, පරිසසම්පත්ති, කම්මවාචාසම්පත්ති, යන මොහුයි. එහි “**නිමිත්තසම්පත්ති**,, නම්=“පබ්බත නිමිත්තං, පාසාණ නිමිත්තං, වන නිමිත්තං, රුක්ඛ නිමිත්තං, මග්ග නිමිත්තං, වම්මික නිමිත්තං, නදී නිමිත්තං, උදක නිමිත්තං,,යි—ඛන්ධකයෙහි වදාරණලද අට නිමිත් අතුරෙහි ඒ ඒ දික්භාගයෙහි ලදලද සුදුසු නිමිත්තයන් “පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං, පබ්බතො භන්තෙ එසො පබ්බතො නිමිත්තං,, යන්‍යාදි නයින් මනාකොට කීර්තනය කිරීමයි. “**පරිසසම්පත්ති**,, නම්=හැමට යටත්පිරිසෙයින් සතරනමක් රැස්ව ඒ සීමාබන්ධනය කරණුකැමති ග්‍රාමක්ෂෙත්‍රයෙහි බද්ධසීමා නදී ජාතස්සර යන්ට ඇතුල්නොව ගම්හිසිටි සියළුම උපසම්පන්නයන් අත්පසට පැමිණවීම හෝ ඔවුන්ගේ ඡන්දය හෝ ගැන්මයි. “**කම්මවාචාසම්පත්ති**,, නම්=“සුණාතු මෙ භන්තෙ සංඝො යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා,, යනාදී නයින් වදාරණලද ඤත්ති දුතිය කම්මවාක්‍යය ඤත්තිදෝෂ අනුසාවනාදෝෂ දුරුකොට දශවිධව්‍යඤ්ජනයන් නොපිරිහෙලා කීමයි.

# පඨමො පරිච්ඡෙදො.

මෙසේ සංකර නොවීමෙන් කර්මාභිබව දක්වා සංකරයෙහි දෝෂ දක්වනු පිණිස,

**23. සංකරෙසති සීමානං සොධෙත්වාන කතංපන,**
**කුප්පතෙසංඝකම්මන්ති වුත්තමට්ඨකථායහි.**

“යනාදී කීහු,,—සීමානං, යථොක්තප්‍රකාර බද්ධාබද්ධසීමාවන්ගේ; සංකරෙසති, වෘක්ෂශාඛාදීන් නිසා ඔවුනොවුන්ගේ සම්බන්ධයක් ඇතිකල්හී, (මිශ්‍රකදෝෂයක් හෝ ඇතිකල්හී); අසොධෙත්වා, ඒ මිශ්‍රකදෝෂය ශුද්ධනොකොට; කතං පන සංඝකම්මං, කරණලද සංඝකර්මය; කුප්පතෙඉති, කොප්‍යවේයයි; අට්ඨකථායං, අටුවායෙහි; වුත්තං හි, කියනලද්දේමැයි.

“හී හෙත්වාවධාරණෙ,; යනු බැවින් මෙතැන්හි “හි,, ශබ්ද අවධාරණාර්ථවාචිය, ඔහු “අට්ඨකථාය හි,,යි අස්ථානප්‍රයුක්තවූවද “වුත්තං,, යනු හා සම්බන්ධයි.

සංකරණං සංකරො—මිශ්‍රවීමයි, සීමාවො දෙදෙනෙක් එකවෘක්ෂයක් හෝ ශාඛාදියක් හෝ ස්පර්ශකොට එහෙයින් ඔවුනොවුන් මිශ්‍රව සිටීමයයි සේයි. ‘‘සං,, පූර්වකරධාතුහට, ‘‘සබ්බතොණ්ණවුත්තා වීවා,,යී භාවයෙහි ‘‘අ,, ප්‍රත්‍යය වේ. ‘‘සංවරො,, යනාදිය මෙනි, සංකර, සම්භෙද, සම්බන්ධ, යනු එකාර්ථයි.

මේ සංකර දෝෂයනම්= පාළියෙහි නොආයේයි. සීමන්තරිකා තබන්ට අනුඥාන වදාළ සූත්‍රයෙන් සිද්ධවූ බද්ධසීමාවන් දෙදෙනාගේ බන්ධනකාලයෙහි ප්‍රතික්ෂිප්ත අන්‍යොන්‍ය ස්පර්ශයට අනුලොම් වන හෙයින් පූර්වයෙහි මනාකොට බඳනාලද්දහුද පසුව යම්කිසි ලතා සාඛාදි ද්‍රව්‍යයක් මත්තෙහි දෘශ්‍යමානව ස්පර්ශකොට සිටියාහුනම් එසින්වූ සීමාසම්බන්ධයද, මෙම නයින් අබද්ධසීමාවන්ගේ මෙබඳු සම්බන්ධයද, අකප්පියානු ලොමයයි භාග්‍යවත්හුගේ අභිප්‍රාය දත් අටුවාචාර්යයන් විසින් දෝෂ හෙයින් ප්‍රතික්ෂිප්තයයි. සොළීතෙරහු කියති.

සිද්ධාන්තවාදීහු ‘‘යෙසං භික්ඛවෙ--පෙ--අබ්භානාරහං,, යන පෙළට අනුකූලකොට අටුවාචාර්යයන් විසින් ප්‍රතික්ෂිප්තයයි කියති, එහෙයින්ම කීහු. ‘‘වුත්තනමට්ඨකථායහි,,යී.

යම් ඇජරකෙනෙක් අටුවායෙහි, බද්ධසීමාවන් දෙදෙනාගේද, උදකුක්ඛෙප ගාමසීමාවන් දෙදෙනාගේද, උදකුක්ඛෙප සත්තබ්භන්තර සීමා දෙදෙනාගේද, බද්ධඋදකුක්ඛෙප දෙදෙනාගේද, බද්ධ සත්තබ්භන්තර දෙදෙනාගේද, උදකුක්ඛෙපසත්තබ්භන්තර දෙදෙනාගේද, ගාමසත්තබ්භන්තර දෙදෙනාගේද, සංකරය කියනලද් දේය, සියලු සීමාවන්ටම නොකියනලදැයි කියද්ද, ඔවුන්ගේ මතය දක්වනුපිණිස,

**24. කොචිකාසඤ්චිසීමානං විජ්ජමානෙපිසංකරෙ,**
**කතස්සතං අසොධෙත්වා කම්මස්සාකොපමබ්‍රවුං.**

‘‘යනාදී කීහු,,--කෙචි, ඇතැම් ආචාර්යකෙනෙක්; කාසඤ්චි සීමානං, ඇතම් සීමාවන්ගේ; සංකරෙ, යථොක්ත මිශ්‍රදෝෂය; විජ්ජමානෙපි, පවත්නාකල්හිද; තං, ඒ සම්බන්ධදෝෂය; අසොධෙත්වා, ශුද්ධ නොකොට; කතස්සකම්මස්ස, කරණලද කර්මයාගේ; අකොපං, අකොප්‍යය; අබ්‍රවුං, කීහු.

කෙබඳු සීමාවන්ගේ සංකර දෝෂය ශුද්ධනොකොට කරණලද කර්මයාගේ කොප්‍ය නොවේයයි කියසද ?, ඒ කවර කෙනෙකුන් ගේ මතයෙක්දයි අන්තර්ලීන චොදනාපරිහාරය පිණිස.

**25. ගාමසීමාය සම්බන්ධෙ බද්ධසීමාය සංකරො,**
**සාඛාදීහි න හොතීති චොළියානමිදං මතං.**

“යනාදී කීහු,,—බද්ධසීමාය, බද්ධසීමාවගේ; ගාම්සීමාය, ගාමසීමාවහා සමග; සාඛාදීහි සම්බන්ධෙ, සාඛාදීන් හා සම්බන්ධයක් ඇති කල්හි; සංකරෝනහොතීති, සංකරනොවේයයි; ඉදං, මේ; චොලියානං මතං, සොලීරටවැසි ආචාර්‍ය්‍යයන්ගේ අභිප්‍රායයි.

සිද්ධාන්තවාදීහු “සිද්ධාන්තවාදීහු නම් දූත් සකවාදීහුයි,, ඔවුන් ගේ මතය වලක්වනු පිණිස,

**26. නිස්සයනිස්සිතත්තාංතෙ සංකරාභාවකාරණං,**
**ගාම සීමාය බද්ධාය යථාක්කමං පකප්පයුං.**

“යනාදී කීහු,,—තෙ, ඒ සොලීරටවැසි භික්ෂූහු; ගාමසීමාය, ගාමසීමාවගේද; බද්ධාය, බද්ධසීමාවගේද; යථාක්කමං, පිළිවෙලක්‍රම නො ඉක්ම; නිස්සයනිස්සිතත්තං; ආධාර ආධෙය්‍ය බව; (ගාමසීමාවගේ ආධාරබවහා බද්ධසීමාවගේ ආධෙය්‍යබව යනුයි) සංකරාභාවකාරණං, සංකරනොවීමට කාරණයයි; පකප්පයුං, කල්පනාකළාහුයි.

නි අනෙනා සනතිඑත්‍ථාති නිස්සයො—“ආධාරො,, ආසයොච්ය නිස්සියිත්‍ථාති නිස්සිතො—“ආධෙය්‍යා,,—නිස්සයොච නිස්සිතොච නිස්සය නිස්සිතා—තෙසංභාවො නිස්සය නිස්සිතත්තං, ගාමසීමාව නම්=බද්ධසීමාවගේ ආධාරය, ඒ දෙදෙනාගේ වෘක්ෂශාඛාදි සම්බන්ධ යෙන් සංකරදෝෂ වේනම් ග්‍රාමසීමාවෙහි බද්ධසීමාව කෙසේනම් ස මමතකටහැකිද ? යම්සීමාවක් හා සමග යම් සීමාවකගේ සම්බන්ධ දෝෂයෙක් ඇත්නම් ඕතොමෝ එහිබඳින්ටම නොවටිය, බද්ධසීමා උදකුක්ඛෙපසීමා ආදිය බද්ධසීමාවට ආධාරනොවනබැවින් එහි සීමාබන්ධනයද ඔවුන්ගේ වෘක්ෂාදිසම්බන්ධයද නොවටනාක්මෙනී, ගාම බද්ධ සීමාදෙදෙනා වනාහී ඔවුනොවුන් නිශ්‍රයනිශ්‍රිත බැවින් පවත් නාහෙයින් ඔවුන් දෙදෙනාගේ වෘක්ෂශාඛාදි සම්බන්ධයක් ඇතිකල් හිද සංකරදෝෂ නොවෙයි යනු සොලීතෙරුන්ගේ අභිප්‍රායයි.

27\. අයංඉමිස්සාසීමාය නිස්සයානිස්සිතා ඉමං,
සීමාසම්මුතිකප්පොයං නහොතිවිනයානුගො.

අයං, මේ ගාමසීමාතොමෝ; ඉමිස්සාසීමාය, මේ බඩසීමාවට; නිස්සයා, ආධාරවෙයි; අයං සීමා, මේබඩසීමා තොමෝ; ඉමං නිස්සිතාඉති, මේ ගාමසීමාවට ආශ්‍රයකරණ ලද්දීයයි; අයං කප්පො, මේ පරිකල්පයතෙම; විනයානුගො න හොති, විනයානුරූප නොවේ; (විනයට සුදුසු නොවෙයි.) (යම් කාරණයකින් විනයානුරූප නොවේද ඒ කාරණය දක්වනු පිණිස.)

28\. ද්විනනමෙකත්‍ර සීමාන මවඨානං නවිජ්ජති,
යදිවිජ්ජතිතත්‍රඨා නානාසංවාසකාසියුං.

“යනාදීකිහු,,—විනනංසීමානං, ගාමබඩ සීමාවන් දෙදෙනාගේ එකත්‍ර, එක්පෙදෙසෙක්හි; අවඨානං, පිහිටීමෙක්; නවිජ්ජති, නොපවත්නේය; යදිවිජ්ජති, (මේ සොළීතෙරුන් විසින් කියනලද ප්‍රකාරයෙන් ග්‍රාමබඩසීමාවන් දෙදෙනාගේ ආධාරාධෙය බැවින් එකපෙදෙසෙක්හි පිහිටීමෙක්) ඇත්නම්; තත්‍රඨා, එකපෙදෙසක පිහිටි ග්‍රාමබඩ සීමාදෙක්හි සිටි භික්ෂූහු; නානාසංවාසකාසියුං, සීමානානාසංවාසකයෝ වන්නාහුයි.

එකසීමාවෙක්හි සිටියෝම සමානසංවාසකවෙත්, වෙන්සීමාවල සිටි බැවින් ඔවුන් විසින් කියනලද එක ප්‍රදෙශයෙක්හි පිහිටි උභය සීමාවෙහි සිටි භික්ෂූහු සමානසංවාසක නොවෙත්, නානාසංවාසකම වෙත් යනු මෙහි අභිප්‍රායයි.

29\. තස්මාතෙකම්මපත්තාව නහොන්තීතිභික්ඛවො,
යංතෙහිකතංකම්ම මකම්මංතංසියාතතො.

තස්මා, (යම් හෙයකින් උභයසීමසථයෝ නානා සංවැස්සෝ වෙද්ද) එහෙයින්; තෙ භික්ඛවො, ඒ උභයසීමසථ භික්ෂූහු; කම්මපත්තා එව න හොන්ති පන, එකසීමාවෙක්හිසිට සමානසංවාසකයන් විසින් කටයුතුකර්මයට සුදුස්සෝම නොවෙත්; තෙහි, ඒ නානා සංවාසක භික්ෂූන් විසින්; යං කම්මං කතං, යම් උපසම්පදාදී සංඝකර්මයෙක් කරණලදද; තතො, නානාසංවැස්සන් ගණපූරකකොට කළ බැවින්; තං, ඒ කර්මය; අකම්මං සියා, (“නානාසීමායඨිතචතුත්ථො ච භික්ඛවෙ කම්මං කරෙය්‍ය අකම්මං නචකරණීයං.” යනු වදළ බැවින්) අකර්මයෙක් වන්නේයි.

ගාමසීමාවෙහි පිහිටි බද්ධසීමාවෙහිම සිටිබැවින් උභයසීමට්ඨයෝ නම් නොවෙත්, නානාසංවැස්සෝද නොවෙත්, එකසීමට්ඨයෝම වෙත්යයි සොළීතෙරුන්ගේ අභිප්‍රාය ඇතිකල්හි "එකත්ත" ය නියා දෙෂාරොපණයකරණු පිණිස.

**30. ගාමසීමාසම්බද්ධ සීමා යෙනාපි ලබ්භති,**
**භික්ඛූ තෙකත්තං යන්ති සීමාබන්ධොව නිප්ඵලො.**

"යනාදී කීහු"–ගාමසීමා, ග්‍රාමසීමා තොමෝ; බද්ධසීමාය අනෙතාපි සමෙව ලබ්භති, බද්සීමතුලත් ලැබේනම්; එසා, සීමාදෙක්හි සිටි; තෙ, ඒ භික්ෂූහු; එකත්තං යන්ති, එක සීමාවෙක්හි සිටිබවට යෙත් නම් එසේකල්හි; සීමාබන්ධොව, ගාමසීමාවෙන් වෙන්කරණු පිණිස සීමාබන්ධනය නම්; නිප්ඵලො, නිෂ්ඵලවෙයි. (ග්‍රාම බද්ධ සීමා දෙදෙන වෙන්වෙන්ව සම්භනොවන හෙයින් සීමාබන්ධනය නිෂ්ප්‍රයොජන යයි සේයි).

මෙසේ සිද්ධාන්තවාදීහූ හෙවත් සකවාදීහු චොළිය මතයෙහි දෙස් දක්වා නිරාකරණය කලකල්හි නැවත තමන්ගේ මතය පිහිටුවනු කැමති සොළීභික්ෂූන්විසින් කියනලද කාරණාන්තරයක් දක්වා එද වලක්වනුකැමතිව "අනෙතා" යනාදිය කීහු.

**31. අනෙතාබහිච සීමාය ඨිතානං විටපිනං යතො,**
**සංසට්ඨවිටපත්තාංහි වුත්තමට්ඨකථායති.**

සීමාය, සීමාවගේ; අනෙතාව, ඇතුල්හිද; බහිච, පිටත්හිද සිටියාවූ; විනානං විටපිනං, වෘක්ෂයන් දෙදෙනෙක්හුගේ; සංසට්ඨවිටපත්තං ඔවුනොවුන් සම්බන්ධවූ වෙලෙප් ඇතිබව; අට්ඨකථායං, අටුවායෙහි; යතො වුත්තං, යම්හෙයකින් කියනලදද; ඉතිහි, එහෙයින්ම.

"අට්ඨකථායති" යන්තෙන් "ඉති" ශබ්දයද "විටපත්තාංහි" යනතැනින් "හි" ශබ්දයද ගෙන "ඉතිහි" යයි යෙදුබව දත්තේයි. "ඉති රජිවිපයයීාසෙ දෘෂ්ටාහෙතවිදමපියොඃ" යනු කී බැවින් මෙහි "ඉති" ශබ්ද හෙත්වර්ථයෙහිද–"හිහෙතාව ධාරණෙ" යු බැවින්. "හිශබ්ද අවධාරණයෙහිද වැටෙ.

**32. බද්ධගාමසීමානං සංකරො පන විජ්ජති,**
**වඩ්ඪමානකාරුළ්හකොඨාපි නිමිත්තානන්ති වභාසිනො.**

බද්ධගාමසීමානං, වෘක්ෂයන් දෙදෙනාහට ආධාරවූ බද්ධග්‍රාමසීමාවන් දෙදෙනාගේ; සංකරොපන නවිජ්ජති, සංකරයෙක් නම් නැත; වඩ්ඪමානකරුක්ඛොපි; වැඩෙනස්වභාව ඇති හිදිදඬුපමණවූ හරරුකද; නිමිත්තං නවභාසිතො, යම්හෙයකින් නිමිත්තයයි අටුවායෙහි කියනලදද;(එහෙයින් බද්ධග්‍රාමසීමාවන්ගේ සංකරයෙක් නැති.)

**සිසි. ඉච්චෙවං චොළියභික්ඛූ සංකරභාවකාරණං,**
**වදන්තිපි තෙසං සීමානං නචෙතං තස්සසාධකං.**

ඉච්චෙවං, මේ විප්‍රකාර අටුවාවචනයෙන්; චොළියභික්ඛූ, සොළියභික්ෂූහු; තෙසං සීමානං, බද්ධ ග්‍රාම සීමාවන් දෙදෙනාගේ; සංකරභාවකාරණං වදන්ති, සංකරනොවීමෙහි කරුණු කියත්;එතං, ඔවුන් විසින් කියනලද කාරණය; තස්සසාධකං නචහොති, සංකරනොවීම සිද්ධකරන්නේ නොමවෙයි.

අටුවායෙහි; සචෙපි පොරාණකස්ස,විහාරස්ස පුරත්ථිමායදිසාය අම්බොචෙවජම්බුචාති වෙරුක්ඛා අඤ්ඤමඤ්ඤං සංසට්ඨවිටපා හොන්ති, තෙසු අම්බස්ස පච්ඡිමදිසාභාගෙ ජම්බු විහාරසීමාව ජම්බුං අන්තොකත්වා අම්බං කිත්තෙත්වා බද්ධාහොති, අථ පච්ඡා තස්සවිහාරස්ස පුරත්ථිමාය දිසාය විහාරෙකතෙ සීමං බන්ධන්තා භික්ඛූ තං අම්බං අන්තොකත්වා ජම්බුං කිත්තෙත්වා බන්ධන්ති, සීමායසීමා සම්භින්නාහොති.

යන මේ පාඨයෙන් පුරාණසීමාවට නිමිත්වූ ග්‍රාමසීමායෙහි සිටි අඹරුක සීමාවතුලසිටි දඹරුක හා සමග ඔවුනොවුන් හැනී වෙලී සිටි වෙලෙළප් ඇතිව සිටියදීද, සීමාබන්ධනකාලයෙහි විපත්තියෙක්වත් පසුව ග්‍රාමසීමාවහාසමග සංකරදොෂයෙක්වත් කර්මවිපත්තියෙක්වත් නොවූබව දක්වනලද්දෙය.

අටුවායෙහි—"අන්තොසාරො ජීවමානකො අන්තමසො උබ්බෙධතො අඞ්ගුලො පරිනාහතො සූචිදණ්ඩප්පමාණොපි වට්ටති" යි යටත් පිරිසෙයින් උසින් අටඟල්හා අවටින් හිදිදඬුපමණවූද වැඩෙන ඇතුල්හර රුක නිමිත්තට වටනේයයි කී බැවින් ඒ රුක වැඩෙමින් බද්ධසීමාවට ඇතුල්වූවද සංකරදොෂ නොවේයයි හැඟෙයි, යන මේ දෙකාරණයෙන් දෙසීමාවන්ගේ සංකරදොෂ නැතිබව චොළියභික්ෂූහු කියති—ඒ ඔවුන්ගේ මතිමාත්‍රයෙක්ය යනු තුන්ගණයෙහි අභිප්‍රායයි.

දැන් සිද්ධාන්තවාදීහු තමන්විසින් කියනුලබන කාරණයෙන් සං කරදෙෂ ඇතිබව කීමෙන්ම සොළිතෙරුන්විසින් යටකියනලද දුර්මකාරණය සාධකනොවනබවට ඥාපකහෙතු දක්වන්නාහු “වඩ්ඪමා නක” යනාදිය කීහු.

**34. වඩ්ඪමානකමෙකම්පි නිමිත්තං ධරණීරුහං,**
**කත්වානබද්ධසීමානං ද්වින්නමබ්භන්තරං පුන.**

**35. වඩ්ඪිතොභයපස්සෙහි පවිට්ඨෙහි සාඛිනා,**
**සීමානං සඞ්කරොවුත්තො කම්මකාලෙචසොධනං,**

වඩ්ඪමානකං, වැඩෙන්නාවූ; එකම්පි ධරණීරුහං, එකමවෘක්ෂයෙක්; (ධරණියං රුහතීති ධරණීරුහො—යථාමහීරුහො) නිමිත්තං කත්වාන, නිමිත්කොට; ද්වින්නං බද්ධසීමානං, බඳිනලද දෙසීමාවන්ගේ; අබ්භන්තරං, අබතුර; පුන, අන්කාලයෙක්හි;

වඩ්ඪිතොභයපස්සෙහි, වැඩෙනලද උභය පාර්ශ්වයෙන්; පවිට්ඨෙහි සාඛිනා, ප්‍රවිෂ්ටවූ වෘක්ෂයෙන්; සීමානං, (නිමිත්රුකට ආධාරවූ ග්‍රාමසීමාවගේද නිමිත්රුක් දෙපසින් පිහිටුතැන් ඇති බද්ධසීමාවන් දෙදෙනාගේද යන) තුන්සීමාවන්ගේ; සංකරො, මුසුවීම; වුත්තො, (“එකරුක්ඛොපිච ද්වින්නංසීමානං නිමිත්තං හොති සොපන වඩ්ඪන්තො සීමසංකරං කරොති”)යි අටුවායෙහි කියනලද; “අට්ඨකථායං,, යි ගම්‍යමානාපි ඇති හෙයින් නොකීහු) කම්මකාලෙ, (තුන්සීමාවන් අතුරෙහි එක්තරාසීමාවකසිට) සඟකම්කරණකල්හි; සොධනච, (ඉතිරි දෙසීමායෙහි සිටි භික්ෂූන් අත්පසටගෙණහෝ බිහිසිම්කොටහෝ;) සීමාසොධනයද; වුත්තං, කියනලදී.

“සංකරො”යනු බලා පුල්ලිඞ්ගුවසයෙන් ප්‍රයොගකරණලද “වුත්තශබ්දය” සොධනං යන තැනට අධිකාරවශයෙන්ගෙණ නපුංසක ලිඞ්ගුවශයෙන් පෙරලා “වුත්තං”සි යොදනු.

**36. තස්මානසංකරාභාව ගාහොසිද්ධන්තියුත්තිතො,**
**අන්තො බහිච සංසට්ඨ විටපොභයරුක්ඛතො.**

තස්මා, යම්හෙයකින් කියනලදද එහෙයින්; අන්තො ච, සීමාවගේ ඇතුල්හිද; බහිච, සීමාවෙන් පිටත ග්‍රාමසීමායෙහිද සිටි; සංසට්ඨ විටපො භයරුක්ඛතො, ඔවුනොවුන් සංසට්ඨ විටපත්වයෙන් වෙසෙ

සනලද; අඹදඹ දෙරුකින්, සංසට්ඨවිටපනම්-ඔවුනොවුන් සම්බන්ධ වූ වෙලෙප් ඇතියනඅර්ථයි. (කඞ්ඛාවිතරණී ගැටපදයෙහි "සංසත්ත" ඇලිසිරීයයි අර්ථකීහු.) සංකරාභාවගාහො, සංකරණනාවේයයි ගැන්ම; යුත්තිතො, කාරණ යුක්තිහෙයින්; න සිජ්ඣති, සිද්ධනොවේ.

දූන් සංකරදෝෂ නොවීමට සාධකකොට කියනලද වැඩෙන්නා වූ හිදිදඬු පමණ ඇති රුක්නිමිත සාධක නොවනබව දක්වනු පිණිස "නිමිත්තුපගභූතස්ස" යනාදි කීහු.

**37. නිමිත්තූපගභූතස්ස හෙට්ඨිමන්තෙනසාඛිනො,**
**සූචිදණ්ඩප්පමාණස්ස වචනෙනාපිවඩ්ඪිතො.**

හෙට්ඨිමන්තෙන, යටත්පිරිසෙයින්; සූචිදණ්ඩප්පමාණස්ස, ලක්දිව පන්හින්දඬු පමණවූ: (හෙද සුලඟිලිපමණයයි කියත්) වඩ්ඪිතො, (වඩ්ඪනං වඩ්ඪි-තතො වඩ්ඪිතො) වැඩෙනහෙයින්; නිමිත්තූපගභූතස්ස, තක්සාරත්වයෙන් වෙන්ව අන්තස්සාරබැවින් නිමිත්තයොග්‍යවූ; සාඛිනො, වෘක්ෂයාගේ; වචනෙනාපි, කීමෙනුදු. (යථොක්ත වෘක්ෂය නිමිත්තට වටනේයයි අටුවායෙහි කියනලද වචනයෙනුදු යනඅර්ථයි) "සංකරාභාවගාහො න සිජ්ඣති"යි යොදනු.

**38. සචෙ සො තෙන රූහෙය්‍ය පුබ්බාපරවිරොධිනී,**
**සියා අට්ඨකථා තස්මා ගාහො ගය්හූපගො නසො.**

සො, ඒ සංකරනොවේයයි ගැන්ම; තෙන, යථොක්ත කාරණ යෙන්; සචෙ රූහෙය්‍ය, විරූඪවෙනම්; අට්ඨකථා, අට්ඨකථාතොමෝ පුබ්බාපර විරොධිනී භවෙ, පූර්ව වචනයට අපරවචනයෙන් විරූඪවයි පින්නි වන්නීය ("එකරුක්ඛොපිච" යනාදිපූර්වවචනයෙන් ග්‍රාමබද්ධ සීමාවන්ගේ සංකරදක්වා "සංසට්ඨවිටපාදි" අපරවචනයෙන් සංකර නොවෙනබවෙක් දක්වූව අටුවාකථාව පූර්වාපරවිරූඪවෙයි යනුභාවයි) තස්මා, යම්හෙයකින් අටුවාකථාව පූර්වාපරවිරූඪවේද එහෙයින්; සො, සංකරනොවේයයි ගැන්ම; ගය්හුපගො නහොති-(ගහිතබ්බං ගය්හං-ගය්හං උපගච්ඡතීති ගය්හුපගො) ගතයුත්තට සුදුසු නොවේ නොගතයුතුයයි සේයි.

දූන් "ඡින්නංති" යනාදි ගයින් නොගතයුතුබව සාධත්.

**39. ඡින්නංතිමජ්ඣෙසීමානං ගාමසීමංසියොතරු,**
**අන්තරාබද්ධසීමානං කථංනාසංකරංනයෙ.**

හි, එසේමය; ති න්නං සීමානං මජ්ඣෙ, දෙපසසිටි බද්ධසීමාවන් දෙදෙනාගේ මධ්‍යයෙහි; ගාමසීමනිස්සිතොතරු, ග්‍රාමසීමායෙහිසිටි වැඩෙන වෘක්ෂයතෙම; බද්ධසීමන්තං, උභය බද්ධසීමාබවට; අගන්ත්වා, වැඩීම්වසයෙන් නොගොස්; තා, ඒ සීමාවන්; කථං, කවර ප්‍රකාරයකින්; සංකරං, සංකරබවට; නයෙ, පමුණුවන්නේද.

මෙහින් කුමක්කිවුදයත්, “සීමායජාතං යංකිංචි යත්ථකත්ථචි එකසම්බන්ධෙන ගතං සීමසංඛං ගච්ඡති” යන මෙයින් සීමාවමතනහි හටගත් එහි පැවති පූර්වයෙහි සිටි පසුව උපන් එහි පිහිටි යම්කිසි සවිඥ්ඥාණක අවිඥ්ඥාණක වතෙක් ඇද්ද-සීමාවහා එකසම්බන්ධයෙන් හෙවත් එකටමිශ්‍රවීමෙන් යම්කිසිතැනකටගිය වෘක්ෂලතාදියක් ඇද්ද-ඔහු සියල්ලම සීමාව්‍යවහාරයට යෙයි අටුවාහෙහි කී බැවින් දෙපාර්ශ්වයෙන් වැදී සීමාවහා එකටසම්බන්ධවීමෙන් ගොස් දෙපාර්ශ්වයෙන් බද්ධසීමාවයට ඇතුල්වූ ග්‍රාමසීමායෙහි සිටි නිමිත්රුක තුන්සීමාවන් මිශ්‍රකරණබැවින් සීමාසංකරය උපදවන්නේය යනුයි.

වැඩෙනලද රුක බද්ධසීමාප්‍රදෙශයට පැමිණම සංකරකෙරෙයිස නුදක්වන පිණිස “යස්මා” යනාදිකීහු.

**40. යස්මා සගාමසීමට්ඨො බද්ධසීමානමන්තරං,**
**පවිට්ඨො තෙනසොබද්ධ සීමසංඛ්‍යං යතොගතො.**

ගාමසීමට්ඨො, ගම්සිමසිටි; සො, ඒ නිමිත්රුක; බද්ධසීමානං අන්තරං, බද්ධසීමාවන් දෙදෙනා අතරට; යස්මාපවිට්ඨො, වැඩී උභයපාර්ශ්වයෙන් යම් හෙයකින් ප්‍රවිෂ්ටවීද; තෙන, ඒ පිවිටුහෙයින්; සො, ඒ වැඩුනුනිමිත්රුක; යතොබද්ධසීමසඞ්ඛ්‍යං ගතො, යම්හෙයකින් බද්ධසීමා ව්‍යවහාරයට ගියේවේද.

**41. සීමායොසංකරංනෙති තිස්සොපෙස ද්‍රුමොතතො,**
**බද්ධසීමාද්වෙචෙව ගාමසීමං ස නිස්සයං.**

තතො, ඒ බද්ධසීමාව්‍යවහාරයට ගියහෙයින්; එසොද්‍රුමො, මේවෘක්ෂයතෙම; ද්වෙබද්ධසීමාචෙව, බද්සිම් දෙදෙනාද; සනිස්සයං ගාමසීමංච, තමහටනිශ්‍රයවූ ග්‍රාමසීමාවද යන; තිස්සොපි සීමායො, තුන්සීමාවන්ම; සංකරංනෙති, සංකරබවට පමුණුවයි.

එසේ වැඩුනුරුකින් තුන්සීමාවෝම සංකරවෙත්නම් වෘක්ෂයන් දෙදෙනාගේ අන්‍යොන්‍ය සම්බන්ධය හඟවන “සංසට්ඨවිටප” වචන

ස කුමක්හෙයින් අටුවාසෙහි කියනලදද යන ආශඞ්කාපරිහාරය පිණිස "සංසඨ්ඨවිටපා" යනාදිය කීහු.

42. සංසඨ්ඨවිටපානිද මාසන්නානිවිටපානානං,
චිත්තකංඩුවනං දීපෙති සීමායමෙහදසාධකං.

43. නාසඤ්ඤමඤ්ඤං ඵුසිත්වාන සංසිබ්බිත්වාසිත්තානං,
විටපාකානත්‍ය දීපෙති පුබ්බාපරවිරොධතො.

සංසඨ්ඨවිටපා ඉති, සංසඨ්ඨවිටපා යන; ඉදං, මේ අටුවාවචනය; සීමාසම්භෙද සාධකං, බද්ධසීමාවන් දෙදෙනාගේ සම්භින්නතාය සිද්ධකරණ්ණාවූ; චිණ්ණං දුමානං, වෘක්ෂයන් දෙදෙනාගේ; ආසණ්ණ විටපතානං, සමීපවූ වෙලෙප් ඇතිබව පමණක්; දීපෙති, ප්‍රකාශ කෙරෙයි.

විටපානනතු, විටපයන්ගේ වනාහී; අඤ්ඤමඤ්ඤං ඵුසිත්වාන, ඔවුනොවුන් සපර්ශකොට; සංසිබ්බිත්වා, වෙලී; ඨිතත්තනං, ග්‍රාමබද්ධසීමාවන්ගේ සංකරබව සාධම්න් සිටිබව; නදීපෙති, ප්‍රකාශනොකෙරෙයි; (කුමක්හෙයින්දයත්) පුබ්බාපරවිරොධතො, අටුවාකථාව පූර්වාපර විරුද්ධවන හෙයිනි.

"සං" පූර්වවූ සජධාතු එක්වීම වෙන්වීම යන දෙ අරුත්හී වැටෙයි, "මූලංමූලෙන සංසඨ්ඨං සාඛාසාඛානි සෙවතෙ" යනාදියෙහි සඞ්ගාර්ථයෙහිද, "කාලෙසංසත්තං කාලෙනිපක්කං" යනාදියෙහි වියොගාර්ථයෙහිද වෙයි.

සංසඨ්ඨ ශබ්දය "සං"පූර්වසජ යන්නහු කෙරෙන් "ත ප්‍රත්‍යයකොට, "සාසදිසතො තස්සරිඨො ච" යන සූත්‍රයෙහි "ච" ග්‍රහණයෙන් "ත"හට "රඨ" යනාදෙශහා "රම්හිරන්තො රාදිතො" යන සූත්‍රයෙන් රකාර ධාත්වන්තයන්ට ලොප්කලකල්හි සිද්ධවෙයි.

සංසත්ත ශබ්දය "සං" පූර්වසජ යන්නහු කෙරෙන් "ත" ප්‍රත්‍යය කොට "ත"පරකල්හි "භූජාදීනමන්තො නොච්ච" යි ධාත්වන්තයාහට ලොප්හා "ත" ප්‍රත්‍යයාහට චිත්තකලකල්හී සිද්ධය, දෙතැන්හිම "සං" පූර්වසජ ගතිම්හි යන ධාතුයි, මෙතැන්හි "සං"යන උපසර්ග ධාත්වර්ථ බාධකවෙයි. "අනෙකත්ථාහි, ධාතවො" යනු බැවින්, ධාතුන්කමන් නානාර්ථ බැවින්හෝ මෙසේවෙයි.

ඉදින් සඞ්ඝාපිවශයෙන් සිඩවූ සංසඪ ශබ්දය ගතහොත් අටුවා වචනයන්ගේ පූර්වාපරවිරුඬ්ධයවෙයි, වියොගාපි වශයෙන් සිඩවූ සංසත්ත ශබ්දය ගත්කල විරුඬනොවෙයි, එහෙයින් කාරණාපුකතිවශයෙන් වෙත්ව සිටි සම්පබවම හැහෙයියනු සිඩාන්තවාදීන්ගේ අභිප්‍රායයි.

දැන් සිඩාන්තවාදීහු යුක්තිහෙයින් චොළියමත නිවාරණයකොට ආගමහෙයින්ද නිවාරණයකරණුපිණිස "තථෙව" යනාදිකීහු.

**44. තථෙවපටිපාදෙසුං ටීකාගණ්ඨිපදෙසුචපි,**
**විනයඤ්ඤූ තදඤ්ඤූතු අහුතබ්බිපරීතතො.**

තථෙව, මාවිසින් කියනලද ක්‍රමයෙන්ම; ටීකාගණ්ඨිපදෙසු අපි, සැරියුත් ථෙරසාමින් වදාල "සාරාර්ථදීපනී" නම් විනය ටීකායෙහිද-වජ්‍රබුඩිතෙරුන් කල පුරාතන "විනයගැටපද" යෙහිද; විනයඤ්ඤූ විනයදත් පූර්වාචාර්යයෝ; පටිපාදෙසුං, හැගවූහු; ("පටි" පූර්වවූ පද; ධාතු බොධනයෙහිද වැටෙයි, "බොධනෙව පධානෙව විඤ්ඤෙයං පටිපාදනං" යනු නිඝණ්ඩුයි) තදඤ්ඤූ, ඒ විනයධරයන් කෙරෙන් අන්‍යවූ ආධුනිකාචාර්යයෝ වනාහී (මෙහි "තු" ශබ්ද "පන" ශබ්දාර්ථයි); තබ්බිපරීතතො, ටීකා ගැටපදවලට විපරීතකොට; ආහු, කීහු.

විනය ටීකායෙහි "සංසඪවිටපාති ඉමිනා ආසන්නතත්තං දීපෙති" යන්නෙන්ද-විනය ගැටපදයෙහි "සංසඪ විටපාති ඉමිනා ආසන්නභාවො කථිතො" යන්නෙන්ද-පුරාතනයෝ වියොගාපිවාචි සජ ධාතුහුගේ වශයෙන් ඔවුනොවුන්ගේ අසම්බන්ධභාවය හැගවූහ, ඉදානීන්තනයෝ වනාහි එයට විරුඬකොට ඔවුනොවුන්ගේ සම්බන්ධභාවය කීවාහුය යනුභාවයි.

**45. පඨමංසම්මතංසීමං සම්භින්දනෙනානසම්මතා,**
**පච්ඡාසීමාඅසීමාති පාළියාඅනුලොමතො.**

**46. සබ්බාසම පිසීමානං පච්ඡාජාතොපිසංකරො,**
**අඤ්ඤකථායමක්ඛාතො වජ්ජනාබ්බාතිනාඤ්ඤුභි,**

පඨමං සම්මතං, පළමුකොට සම්මතවූ; සීමං, සීමාව; සම්භින්දනෙනන, මුසුකරණුහුව්සින්; පච්ඡාසම්මතා සීමා, පසුසම්මත සීමාතොමෝ; අසීමාති, අසීමාවයයි හගවන; පාළියා, පෙළට; අනුලොමතො, අනුලොම්හෙයින්.

සබ්බාසං අපි සීමානං, සියලුම සීමාවන්ගේ; පච්ඡාජාතො සංකරොපි, පසුව උපන් සංකරයද; තඤ්ඤෙහි, සංකරයෙහි දොෂ දන්නවුන් විසින්; (විනයඥයන් විසින් හෝ) වජ්ජෙතබ්බොති, දුරුකටයුත්තේයයි; අට්ඨකථායං අක්ඛාතො, අටුවායෙහි කියනලදී.

මෙහි අභිප්‍රායනම්="යෙසං භික්ඛවෙ සීමා පච්ඡාසම්මතා තෙසං තං කම්මං අධම්මිකං කුප්පං අට්ඨානාරහං" යනුවෙන් ප්‍රථමසම්මතසීමාව සම්භින්නීයකොට පසුවබඳනාලද සීමාව අසීමාවයයි වදාළ බැවින් මනාකොට බඳනාලද සීමාවන් දෙදෙනාගේද වෘක්ෂශාඛාදි සපශීයෙන් පසුව උපන් සංකරය යථොක්ත පාළියට අනුලොම්හෙයින් නොවරීය, හුදක් බද්ධසීමාවන් දෙදෙනාගේම පමණක් නොවෙයි, මෙමනයින්, සියළුම සමානසංවාසක සීමාවන්ගේ සංකරදොෂ ඇති බවද ඒ දුරුකටයුතුබවද අටුවායෙහි කියනලද යනුයි.

මෙම ටීකායෙහි, "සබ්බාසම්පි" යන්නෙහි "අපි" ශබ්දසම්පිණ්ඩනාර්ථයයි කියාතිබෙයි. "සබ්බාසං" යන්නෙන් සියලුසීමාවන් ගත්කල "අපි" ශබ්දයෙන් සම්පිණ්ඩනය කටයුතු සීමානම් කවරද? එහෙයින් 'සබ්බාසම්පීති එත්ථ අපිසද්දො සම්පිණ්ඩනත්ථො" යනාදී ප්‍රපඤ්චය පිරික්සියයුතු. "පච්ඡාජාතොපි" යනතැන "පි" ශබ්දය සම්භාවනාර්ථය, එයින් සීමාබන්ධනයට ප්‍රථමයෙන්වූ සම්බන්ධයාගේ නොවටනා බව පළමුමැයි දක්වත්.

මෙසේ සිද්ධාන්තවාදීහු චොළියමතයෙහි දෙස් දක්වා, අටුවාවචනයෙන් දුරුකටයුතු සංකරයද දක්වා නැවත තමන්ගේ මතය පිහිටුවනු කැමති සොළීභික්ෂූන්ගේ මතය දක්වනුපිණිස, "**යථානජ්ජාදයො**" යනාදී කීහු.

**47. යථානජ්ජාදයො හොන්ති උදකුක්ඛෙපනිස්සයා,**
**තථෙවගාමසීමාපි බද්ධ සීමාය නිස්සයා.**

නජ්ජාදයො, නදීජාතස්සර සමුද්‍රයෝ; උදකුක්ඛෙපනිස්සයා, උදකුක්ඛෙපයට නිශ්‍රයවූවාහු; යථා හොන්ති, යම්සේවෙද්ද; තථෙව, එසේම; ගාමසීමාපි, ග්‍රාමසීමාවද; බද්ධසීමාය නිස්සයා, බද්සිමට ආධාරවෙත්.

**48. නිස්සයනිස්සිතාසීමා අඤ්ඤමඤ්ඤං අසංකරා,**
**විජ්ජමානෙපි සම්බන්ධෙ සාඛාදීහිහිචාහුකෙ.**

නිස්සය නිසසිතා සීමා, නිශ්‍රසවූ ගාමසීමාවහා නිශ්‍රිතවූ බඩසීමා වද යනමේ දෙසීමාවෝද; සාඛාදීහි, ශාඛා ප්‍රරොහාදියෙන්; සම්බන්ධෙ විජ්ජමානෙපි, සම්බන්ධයක් ඇතිකල්හිද; අසඞ්කමසඞ්කං, ඔවුනොවූන්; අසංකරා, (නදී ආදියසමග උදකුකෙඛපසීමාවමෙන්) අමිශ්‍ර වෙත්; ඉතිව, මෙසේද; නෙ, ඒ සොළිහිස්සුනු; ආහු, කීහු.

යම්සේ ග්‍රාමසීමාහෙති වර්ගීකර්ම දුරුකිරීම පිණිස බොහෝ බඩසීමාද, ඒ බඩසීමාවන් දෙදෙනාඅතරෙහි ඔවුනොවුන්ගේ අසම්මිශ්‍රභාවයපිණිස සීමන්තරිකාද, අනුදනනාලදද, එසේම අරණ්‍යයෙහිත් සත්තබ්භන්තරසීමාද, ඒ සත්තබ්භන්තර දෙදෙනා අතරෙහි සීමන්තරිකාද, ඉපළ අටුවා දෙක්හි නියමකරණ සාමර්ථ්‍යයෙන් අරණ්‍යයාගේද සවභාවයෙන්ම නදී ආදීන්ගේමෙන් සීමා බවද, එහි වර්ගීකර්ම පරිහාරය පිණිසම සත්තබ්භන්තරසීමා අනුදත් බවද සිද්ධය.

මෙම සාමර්ථ්‍යයෙහෙණ, ''සබ්බා හිසක්වෙ නදී අසීමා'' යනාදීන් පිළිබෙවු කරණලද බඩසීමාවන් ඇත්නාවූද නදී සමුද්‍ර ජාතස්සරයන්ගේ සවභාවයෙන්ම සීමාබව අටුවායෙහි කියනලද්දේය.

එහෙයින් බඩසීමාවට ආධාරවූ ග්‍රාමසීමාවමෙන් උදකුකෙඛපසීමාවට ආධාරවූ නදී සමුද්‍ර ජාතස්සරයෝද සත්තබ්භන්තර සීමාවට ආධාරවූ අරණ්‍යයද යනමොහු සකල සඞ්ඝකර්මයට යෝග්‍යවූ වෙන් වෙන් සීමාසතරෙකැයි සොළිතෙරනු කියත්, චොළියාචාර්‍ය්‍යයන් විසින් කියනලද වචනය නිරාකරණය කරණුනු ''උදකුකෙඛප'' යනාදිය කීහු.

## 49. උදකුකෙඛපමනෙතන නදීජාතස්සරණ්ණවා, අබඩසීමී නාංගනති න සබ්බෙ බඩසීමනං.

නදීජාතස්සරණ්ණවා, නදීජාතස්සර සමුද්‍රයෝ, උදකුකෙඛපමතෙතන, උදකුකෙඛප ප්‍රමාණයෙන්; අබඩසීමතං යනති, අබඩසීමාබවට යෙත්; සබ්බෙ, සියළු ප්‍රදෙශයෝ; නයනති, අබඩසීමාබවට නොයෙත්; බඩසීමතඤ්ච නයනති, ඔවුන්ගෙන් එක්පෙදෙසකුදු බඩසීමාබවටද නොයෙත්යයි''ච''ශබ්දයෙන් අධ්‍යාහාරකොට යොදනු.

නොහොත් නදීජාත්සසරණ්ණවා, යම් නදී ජාතස්සර සමුද්‍රකෙනෙක්; උදකුකෙඛප මතෙතන, උදකොක්ෂෙප මාත්‍රයෙන්; අබඩසීමතංයනති, අබඩසීමාබවට යෙද්ද; ඒ නදී ජාතස්සරසමුද්‍රයෝ, සබ්බෙ;

සකල ප්‍රදේශයෝ; නයනත්‍ති. අබද්ධසීමාබවට නොයෙත්, බද්ධසීමත්තං න යන්ති, බද්ධසීමාබවට වනාහි එකප්‍රදේශයෙක්ද නොයෙත්යයි මෙසේ හෝ අල්ගන්නේ.

"සබ්බා හික්ඛවෙ නදී අසීමා සබ්බො සමුද්දො අසීමො සබ්බො ජාතස්සරො අසීමෝ" යනු වදාළබැවින් නදී සමුද්‍ර ජාතස්සරයන්ගේ එකදෙශයෙක්ද බද්ධසීමා නොවෙයි, "නදියාවා හික්ඛවෙ සමුද්දෙවා ජාතස්සරෙවා යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛෙපා අයං තත්‍ථ සමානසංවාසා එකූපොසථා" යනු වදාළ බැවින් නද්‍යාදීන්ගේ උදකුක්ඛෙප ප්‍රමාණප්‍රදෙශයෝම අබද්ධසීමානම් වෙත්, එයින් ඉතුරු සියළු නදී ජාතස්සර සමුද්‍ර ප්‍රදේශයෝ අබද්ධසීමාද නොවෙත්, පාෂාණ නිමිත්තාදියෙන්බා සම්මතාවූවාහුද බද්ධසීමාද නොවෙත්, අසීමාමය යනු අභිප්‍රායයි.

දැන් කියනලද අභිප්‍රාය පහලකරණු පිණිස "මජ්ඣිමස්ස" යනාදිය කීහු.

**50. මජ්ඣිමස්සොදකුක්ඛෙප පරිච්ඡින්නප්පදෙසතො,**
**පදෙසො බාහිරො තෙසං මසීමායෙවසබ්බසො.**

තෙසං, ඒ නද්‍යාදීන්ගේ; මජ්ඣිමස්ස උදකුක්ඛෙපපරිච්ඡින්න ප දෙසතො. බලමැදුම් පිරිමිහුගේ උදකුක්ඛෙපයෙන් පිරිසිඳිනලද ප්‍ර දෙශයෙන්; බාහිරොපදෙසො, බාහ්‍ය ප්‍රදෙශයතෙම; සබ්බසො, සර්ව ප්‍රකාරයෙන්; අසීමායෙව, අසීමාමැයි.

**51. ඔත්ථරෙණ කාරකෙ සඞ්ඝෙ අන්තොනජ්ජාදිනං පන,**
**උදකුක්ඛෙපසීමාසා ලබ්භතෙ න පනඤ්ඤථා.**

නජ්ජාදීනං අන්තො, නදී ආදීන්ගේ ඇතුල්හී; කාරකෙ සඞ්ඝෙ ඔත්ථරෙණ පන, කාරකසංඝයා බටකල්හී; සා උදකුක්ඛෙප සීමා, ඒ උදකුක්ඛෙප සීමාතොමෝ; ලබ්භතෙ, ලැබේ; අඤ්ඤථා පන නලබ්භ තෙ, නොබටහොත් නොලැබේ; (එහෙයින් නදීආදීහු අසීමාමයයන අදහසි.).

**52. නජ්ජාදයො අසීමාව උදකුක්ඛෙපනිස්සයා,**
**භවන්තීතො සංසීවන්තං පාළියා න සමුබ්ධං.**

නජ්ජාදයො, නදීආදීහු; අසීමා එව (හුත්වා), අසීමාමව; උදකු ක්ඛෙප නිස්සයා භවන්ති, උදකුක්ඛෙපසීමාවට ආධාරවෙත්; පාළියා

පන, පෙළෙහිවනාහී; තෙසං, ඒ නදී ආදීන්ගේ; සීමන්තං, සීමාබවෙ ක්; න උඩටං, නො උදුරණලද.

එසේකල අටුවායෙහි නදියගේ සීමාබව කුමක්හෙයින් කිය නලද්දැයි චොදනා සඳහා "වුත්තමට්ඨකථායං" යනාදිකීහු.

**53. වුත්තන්තමට්ඨකථායං සීමන්තං නදියා පන,**
**උදකුක්ඛෙපමත්තන්ත මපෙක්ඛිත්වාව භාසිතං.**

අට්ඨකථායං පන, අටුවායෙහි වනාහි; නදියා, ගඟාවගේ; යං සීමන්තං වුත්තං, යම් සීමාබවෙක් කියනලද්දේනම්, ඒ සීමාබව; උද කුක්ඛෙප මත්තං එව අපෙක්ඛිත්වා; උදකුක්ඛෙප සීමාවම අපෙක්ෂා කොට; භාසිතං, කියනලදී.

අරඤ්ඤයවනාහී කෙසේද්දැයි චොද්‍යමනය සිත්හිකොට "**සත්ත බ්භන්තරමත්තොව**" යනාදී කීහු.

**54. සත්තබ්භන්තරමත්තොව පදෙසොරඤ්ඤසීමතං,**
**අගාමකෙඅරඤ්ඤස්මිං යාතිනොබාහිරොතතො.**

අගාමකෙ, ග්‍රාමක්ෂෙත්‍ර විරහිතවූ; අරඤ්ඤස්මිං, වින්ධ්‍යාටවී ආදී යෙහි; සත්තබ්භන්තර මත්තොව පදෙසො, සත් අබතුරු පමණවූම ප්‍රදෙශයතෙම; අරඤ්ඤසීමතං යාති, අරඤ්ඤසීමාබවට යෙයි; තතො බාහිරො, ඒ සත් අබතුරු පමණින් පිටත්හිවූ ප්‍රදෙශයතෙම; නො(යා ති), අරඤ්ඤසීමාබවට නොයෙ; අසීමාමවෙයි යන අර්ථයි.

කෙසේ හැගේද්දැයි යනුතකා "**සත්තබ්භන්තරමත්තස්ස**" යනාදි කීහු.

**55. සත්තබ්භන්තරමත්තස්ස සීමන්තවචනම්පන,**
**සෙසාරඤ්ඤපදෙසස්ස අසීමත්තනියාමකං.**

නිපාතයන් තමන් නානාර්ථබැවින් "සීමන්තවචනම්පන" ය න්නෙහි "පන" යනු යසමාදර්ථයි.

පන, යම්හෙයකින්; සත්තබ්භන්තර මත්තස්ස, සත්අබතුරුමා ත්‍රයාගේ; සීමන්තවචනං, සීමාබවකීම; සෙසාරඤ්ඤපදෙසස්ස, සෙසු අරණ්‍යප්‍රදෙශයාගේ; අසීමත්ත නියාමකං, අසීමාබව නියමකෙරේද; එහෙයින් හැගේ.

සත්තබ්භන්තර මාත්‍රයෙන්බාහ්‍යවූඅරණ්‍යප්‍රදෙශය අබද්ධසීමාද නොවෙයි, පාෂාණාදි නිමිත්තනබා බන්ධනයකළද බද්ධසීමාදනොවෙ යියනුභාවයි.

මෙසේ නදීජාතස්සර සමුද්‍ර අරණ්‍යයන්ගේ විශෙෂදක්වා දැන් ග්‍රාමක්ෂෙත්‍රයාගේ විශෙෂ දක්වනුපිණිස "සකලංමෙ" යනාදියකීහු.

**56. සකලංවෙකදෙසංවා ගාමක්ඛෙත්තමුපාදිය,**
**සම්මතාබද්ධසීමාසා ගාමසීමානහොතිසා.**

සකලං ගාමක්ඛෙත්තං වා, සියළු ග්‍රාමක්ෂෙත්‍රය හෝ; එකදෙසං වා, ඔහුගේ එකප්‍රදෙසක් හෝ; උපාදිය, ගෙණ; සම්මතා යාසීමා, සම්මතවූ යම් සීමාවෙක් ඇද්ද; සා, ඕතොමෝ; බද්ධසීමා, බද්ධසීමා වෙයි; ගාමසීමා නහෝති, ග්‍රාමසීමා නොවේ.

පූර්වයෙහි ග්‍රාමසීමාව පසුව කෙසේ බද්ධසීමාවේදැයි ආසංකාසඳහා "ජහිත්වා" යනාදි කීහු.

**57. ජහිත්වාගාමසීමත්තං බද්ධසීමත්තමස්සහි,**
**නිමිත්තානමන්තොපදෙසස්ස සඞ්ඝසම්මුතියාතථා.**

තථාහි, එසේමය; අස්ස, ඒ ග්‍රාමක්ෂෙත්‍රයාගේ; නිමිත්තානමන්තොපදෙසස්ස, නිමිත්වලට ඇතුල්හි සිටි ප්‍රදෙශයාගේ; සඞ්ඝසම්මුතියා, සංඝයා විසින් කරණලද සම්මුතිහෙයින්; ගාමසීමත්තං, පූර්වයෙහි වූ ග්‍රාමසීමාබව; ජහිත්වා, හැර; බද්ධසීමත්තං හොති, බද්ධසීම්බවවේ.

"යෙන යස්සහි සම්බන්ධො දූරට්ඨම්පි තස්සතං" යනුබැවින් ගය කෙළවරින් "තථා" යන්නද, ගාථාර්ථයාගේ කෙළවරපෙනෙන "හි" කාරයද ගෙණ, "තථාහි" යනු යෙදූබව දනේනේ, තථාසංඝසම්මුති යා කියාතෝ යොජනාකොටඑසේ සඞ්ඝයාවිසින් කරණලද සම්මුතිය හේතුකොටගෙණයි අපිගන්නේයි.

දැන් සොළිරටවැසසන්ගේ නිශ්‍රයනිශ්‍රිත වාදයාගේ නිරාකරණ ය පිණිස "යථෙකදෙසෙ" යනාදිය කීහු.

**58. යථෙකදෙසෙගාමස්ස විසුංගාමෙකතෙපිසො,**
**පදෙසොනිස්සයොඅඤ්ඤො න්‍යස්සීහොතිනවුච්චති.**

යථා, යම්සේ, ගාමස්ස, ග්‍රාමක්ෂෙත්‍රයාගේ; එකදෙසෙ, යම් එක ප්‍රදෙශයෙක්හි(ග්‍රාමභාගයෙක්),විසුං, පාසාණ නිමිත්තාදියෙන් වෙන් කොට; ගාමෙකතෙ, ග්‍රාමක්ෂෙත්‍රභාවයක් කළකල්හි; සොපදෙසො,

ඒ විසුං ග්‍රාමක්‍ෂෙත්‍ර බවට පමුණුවනලද ප්‍රදෙශයතෙම්; නිස්සිතො, නිශ්‍රිතවෙයි; අඤ්ඤො, වෙන්කළ ගම්කෙතින් අනික් පළමු ගම්වහරින්ව සිටි ගම්කෙත් කොටස; නිස්සයොති, නිශ්‍රයයි; නවුච්චති, නොකියනුලැබේද.

භාවාර්‍ථ ප්‍රකාශක ප්‍රත්‍යයක් නැතිවද ශබ්දයානම සමහරතැනෙක්හි භාවාර්‍ථය ප්‍රකාශකෙරේ, "බුද්ධරතනං" යනාදියෙහි මෙනි, මේ ක්‍රමය "ගාමෙකතෙ" යන්නෙහිද දතයුතු.

**59. තථෛකදෙසෙ ගාමස්ස බද්ධසීමකතෙපි සො,**
**පදෙසො නිස්සිතො අඤ්ඤෙ නිස්සයො ති න වුච්චති.**

තථා, එසේම; ගාමස්ස, ග්‍රාමක්‍ෂෙත්‍රයාගේ; එකදෙසෙ, යම්එක් ප්‍රදෙශයෙක්; බද්ධසීමකතෙපි, බදසිම් ඇතිබවක්කළ කල්හිද; (බද්ධා සීමා යස්මිං සො බද්ධසීමො,—බද්ධසීමෙකතෙබද්ධසීමකතෙ,—බද්ධසීමතෙනකතෙ—යනු අර්‍ථයි) සො, ඒ කරණලද බද සිම්බැව් ඇති; පදෙසො, පෙදෙස; නිස්සිතො, නිශ්‍රිතවෙයි; අඤ්ඤො, එයින් අන්‍යවූ ග්‍රාම ක්‍ෂෙත්‍ර භාගයතෙම; නිස්සයොති නවුච්චති, නිශ්‍රයයි නොකියනුලැබේ. මෙහි උපමාන උපමෙය දෙක්හී "පි" ශබ්ද ගනීර්‍ථයෙහිවැටේ.

**60. උභොපි තා විසුංසීමා න ච නිස්සයනිස්සිතා,**
**සචෙ න සාඛාදිසම්බන්ධො හොන්ති තාසම්පි සංකරො.**

තා උභොපි, ඒ ග්‍රාමබද්ධ සීමාදෙදෙන; විසුංසීමා, යම්හෙයකින් වෙන්වෙන් සීමාවෙද්ද එහෙයින්, නිස්සය නිස්සිතා නච, නිශ්‍රය නිශ්‍රිත නොමවෙත්; තාසං, ඒ දෙසීමාවන්ගේ; සාඛාදි සම්බන්ධෙ සන්තෙ, ශාඛාදි සම්බන්ධයක් ඇතිකල්හි; සංකරොපි හොති, සංකරදවේ.

"නවනිස්සය නිස්සිතා"ති එහි "ච" සද්ද "අවධාරණත්‍ථො" 'සංකරොපීති" එහි. "පි" සද්දො, නිස්සිතභාවං සමුච්චිනොති, මෙසේ සංකරබව දක්වා සංකරනොවනබව දක්වනුපිණිස "සීමාසජාතං" යනාදිකීහු.

**61. සීමාසජාතං සංකිඤ්චි අසීමන්තමුග්ගතං,**
**නජ්ජාදීනං පදෙසං වා එකසම්බන්ධතොගතං.**

සීමායජාතං, සීමාබ්‍යන්තරයෙහි උපන්නාවූ; අසීමංත හං, අසීමාවූ අහසට; එකසම්බන්ධතො උග්ගතං, එකසම්බන්ධවීමෙන් නැංගාවූ; යංකිඤ්චි, යම්කිසි වෘක්‍ෂශාඛාදියෙක් හෝ, නජ්ජාදීනංවා, නදී ආදීන්ගේහෝ; පදෙසං, අසීමා ප්‍රදෙශයට; ගතං, එකසම්බන්ධව ගිය; යම්කිසි රුක්ලිය ආදියෙක්හෝ ඇද්ද.

62. සීමාහොතිසයංයෙන නාසීමායන්තිසංකරං,
අඤ්ඤාසීමන්තරංයස්මිංගතෙසොහොතිසංකරො.

සයං සීමාහොති, හෙතෙම සීමාවෙයි උපන්බැවින් තෙමේ සීමාවෙයි; යෙන, ඒ සීමාවෙකි උපන් වෘක්ෂාදියෙන් මඩනලද, අසීමා,න හොනබූදි ප්‍රදෙශයෝ; සංකරංනයන්ති, සංකරබවට නොයෙත්; න සමිං. ඒ සීමාවෙහි හටගත් වෘක්ෂාදිය; අඤ්ඤා සීමන්තරං ගතෙ, අමුතු සීමාවක් අ තුලට ගියකල; සොසංකරො හොති, ඒ සංකරයවේ.

"සීමන්තරං" යනතැන "අන්තර" ශබ්ද අන්‍යාර්ථයි, "ගාමන්තරං, වනන්තරං, භාසන්තරං, යනාදිය මෙනී, මෙසේ යුක්තිවශයෙන් සංකරනොවනබැව් දක්වා ආගමවශයෙන් දක්වනුපිණිස "නජ්ජාදීනන්තු" යනාදි කීහු.

63. නජ්ජාදීනන්තුසීමත්තං පාළියානපනුද්ධටං,
අඤ්ඤත්‍රොදකුක්ඛෙප පරිච්ඡින්නපදෙසතො.

නජ්ජාදීනන්තු, නදී ආදීන්ගේ; සීමත්තං, සීමාබව; උදකුක්ඛෙප පරිච්ඡින්න පදෙසතො අඤ්ඤත්‍ර, උදකුක්ඛෙපයෙන් පිරිසුන් පෙදෙස හැර; (උදකුක්ඛෙප පරිච්ඡින්න ප්‍රදෙශයෙන් පිටත්තන්හි හෝ); පාළියා නපන උද්ධටං, පෙළෙහි නොම උදුරණලද.

64. අරඤ්ඤස්සාපිසීමත්තං පාළියානපනුද්ධටං,
සත්තබ්භන්තරතොඤ්ඤත්‍ර පරිච්ඡින්නපදෙසතො.

අරඤ්ඤස්සාපි, අරඤ්ඤයාගේද; සීමත්තං, සීමාබව; සත්තබ්භන්තරතො පරිච්ඡින්නපදෙසතො අඤ්ඤත්‍ර, සත්තබ්භන්තරයෙන් පිරිසිඳිනලද ප්‍රදෙශයහැර; (ප්‍රදෙශයෙන් පිටත්තන්හි හෝ) පාළියා නපනුද්ධටං, පාළියෙහි උදුරා නොමකියනලද.

65. ගාමසීමායබද්ධාය සීමායචපනුද්ධටං,
සීමත්තමෙවනාසීම භාවොකත්ථචිපාළියං.

ගාමසීමායච පන, ග්‍රාමසීමාවගේද වනාහී; බද්ධායච සීමායච, බද්ධසීමාවගේද; සීමත්තමෙව, සීමාබවම, උද්ධටං, උදුරාකියනලද; අසීමභාවො, ඒ දෙදෙනාගේ අසීමාබවෙක්; පාළියං කත්ථචි න (උද්ධටො), පාළියෙහි කිසිතැනක නොකියනලද.

**66. යස්මා උභොපිතා සීමා තස්මාවඤ්ඤොඤ්ඤසංකරා,**
**සාබාදීගි භවන්තීති විඤ්ඤාතබ්බා විභාවිනා.**

යස්මා, යම්හෙයකින්; තා උභොපි, ග්‍රාමබද්ධ සීමාසංඛ්‍යාත ඔහු දෙදෙන; සීමා, සීමාවෙද්ද; තස්මාඑව, එහෙයින්ම; සාබාදීති, ශාබාදී යෙන්; අඤ්ඤොඤ්ඤසංකරා සංකරා භවන්තීති, ඔවුනොවුන් සංකර වෙත් යයි; විභාවිනා විඤ්ඤාතබ්බා, නුවනැත්තහු විසින් දතයුත්තාහුයි. දූන් සොළිතෙරුන්ගේ වාදයදක්වනුපිණිස "සීමාබද්ධා" යනාදිකිහු.

**67. සීමාබද්ධොදකුක්ඛෙප සත්තබ්භන්තරනාමිකා,**
**සසීමන්තරිකා හොන්ති සජාතිකා අසංකරා.**

බද්ධොදකුක්ඛෙප සත්තබ්භන්තර නාමිකා, බද්ධ උදකුක්ඛෙප ස ත්තබ්භන්තර යන නම් ඇති; සසීමන්තරිකා, සීමන්තරිකා සහිතවූ; සීමා, මේ තුන්සීමාවෝ; සජාතිහි, එකසබහාග ජාතිඇති සීමාවන් සමග, අසංකරා හොන්ති, සංකරනොවෙත්.

බද්ධසීමාව සීමන්තරිකා ඇතිකල්හි අනික් බද්ධසීමාවක් සමග සංකරනොවෙයි, උදකුක්ඛෙප සත්තබ්භන්තර දෙදෙනද එසේය ය නු භාවයි.

සජාති සීමාවෝ සීමන්තරිකා ඇති කලම අසංකරව සිටිත්, විජා තිසීමාවන්ගේ අසංකරවසිටීමට කුමක්හෙයින් සීමන්තරිකා නොකී යනලද්දැයි චොදනාසඳහා "නසීමන්තරිකා" යනාදිකිහු.

**68. නසීමන්තරිකා වුත්තා විජාතියා න මනන්තරෙ,**
**අඤ්ඤමඤ්ඤංබ්‍යවච්ඡෙද වසෙනෙතා අසංකරා.**

විජාතිනාතං අනන්තරෙ, විසභාගවූ බද්ධ උදකුක්ඛෙප සීමාදීන් අ තුරෙහි; සීමන්තරිකා නවුත්තා, සීමන්තරිකා නොකියනලද; (කුමක් හෙයින්ද) අඤ්ඤමඤ්ඤං බ්‍යවච්ඡෙදවසෙන, ඔවුනොවුන් පිරිසිඳීම් වශයෙන් (නිශ්‍රයභෙද ශවභාවභෙදයෙන් නමන්ම වෙන්වූ හෙයිනැ යි සේයි); එතා, මේ විජාති සීමාවෝ; අසංකරා, සංකරනොවෙත්.

මෙහි අභිප්‍රායනම්–"බද්ධ ග්‍රාම" සීමාවන්ගේද, "බද්ධ උදකුක්ඛෙ ප" සීමාවන්ගේද, "බද්ධ සත්තබ්භන්තර" සීමාවන්ගේද, "ග්‍රාම" උදකු ක්ඛෙප" සීමාවන්ගේද, "ග්‍රාම සත්තබ්භන්තර" සීමාවන්ගේද, "උද

දකුකෙඛප සතතබහනතර" සීමාවන්ගේද, අනතරහි සීමන්තරිකා නැතද, විජාතිසීමාවෝ ඔවුනොවුන් පිරිසිඳිනබැවින් සංකරනොවෙත්, ශාඛාදි සම්බන්ධයක් ඇතිකල වනාහි සංකරදෙවෙත්, එහෙයින් සීමන්තරිකා නොකියනලද්දේය යනුයි.

සීමාලංකාර ටීකාවෙහි, මේගය අභිප්‍රාය කියනතැන, "තත්‍ථාය මයිපපායො, බඩගාමසීම බඩ උදකුකෙඛපසීම බඩ සතතබහනතර සීමානං අනතරෙච, ගාමුදකුකෙඛප ගාමසතතබහනතර සීමානං අනතරෙච, උදකුකෙඛප සතතබහනතර සීමානං අනතරෙච, සීමනතරිකා අඪපිතෙපි විජාතිසීමායො අඤඤමඤඤං පරිචෙඡදනතො සංකරා නහොනති, සාඛාදි සමබනෙධපි නහොනති, තසමා නවුතතානි,, සී. මෙසේ ලියාතිබෙයි.

මෙහි "සාඛාදිසමබනෙධපි නහොනති" යන්නෙන් "බඩ උදකුකෙඛප බඩසතතබහනතර ගාම උදකුකෙඛප ගාම සතතබහනතර උදකුකෙඛප සතතබහනතර,, යන සීමාවන්ගේද සංකර නැතිබවෙක් හැගෙයි, මේ වච නය එහිම චොළියමතයයි දක්වනලද,

"ෙපන අඪකථාය බඩසීමානං අඤඤමඤඤංච අබඩානං උදකුකෙඛපගාමසීමානච උදකුකෙඛප සතත බහනතර සීමානංච" ඉමාසං අඤඤමඤඤම සංකරොවුතෙතා න සබබාසං සීමානනතිවදනති" යනාදියට විරුඬය.

"සාඛාදිසමබනෙධපන නහොනති,,යි පාඨවුව බඩග්‍රාම සීමාදෙදෙනාගේ සංකර ඇතිබවක් හැගෙනහෙයින් හෙද චොළියමතයට විරුඩය, බඩග්‍රාම සීමාදෙදෙනාගේ විජාතීයබවෙක් ඇතද සොළීමතයෙන් බඩ උදකුකෙඛපාදියට සමානනොවෙයි, ඔවුන් දෙදෙනාගේ සංකර නොවීමද නිශ්‍රයනිශ්‍රිතවශයෙන් යට කියනලද්දේය.

එබැවින් මේ පාඨයෙහි "බඩගාමසීම" යන්න අධිකයයි හැගේ ඒ හැරදමා "සාඛාදි සඹනෙධ පන හොනති,, යයිද පාඨය ශුඩකොට ගත්කල බඩ උදකුකෙඛප සීමාදීහු, සීමන්තරිකා රහිතව ඔවුනොවුන් සපහීකොට සිටියාහුද, ජාතියෙන්ම වෙන්වූබැවින් අමිශ්‍රවසිටිත්, ශාඛාදීන්ගේ සම්බන්ධයක් ඇතිකල සංකරවෙත් යන සොළී ඇජරන්ගේ මතය ප්‍රකටවපැනේ.

මෙසේ විජාති සීමාවෝ සීමන්තරිකා නැතද ඔවුනොවුන් පිරිසිඳින හෙයින් සංකර නොවෙත්ලා,සභාගජාති ග්‍රාම්සීමාවන් දෙදෙ

න සීමන්තරිකා නැතිකල සංකර වේද්දැයි චෝදනා පරිහාරය පිණි ස "නසීමන්තරිකා" යනාදිකීහු.

**69. නසීමන්තරිකාලබ්භා ගාමසීමානමන්තරෙ,**
**ලොකෙන කතසංකෙතවසෙනෙවාවවත්ථිතා.**

ගාමසීමානං අන්තරෙ, ග්‍රාමසීමා දෙදෙනා අතුරෙහි; සීමන්තරිකා නලබ්භා, (නලබ්භිතබ්බා නලබ්භා) සීමන්තරිකා ලැබිය යුතුනො වෙයි; (සීමන්තරිකාවෙන් ප්‍රයොජන නැත යනුභාවයි) කුමක්හෙයි න්දයත්; ලොකෙන කතසංකෙත වසෙන, ලෝවැස්සාවිසින් පාසාණාදි නිමිතින්,කරණලද සලකුණුවශයෙන්; එනා, මේ ග්‍රාමසීමාවෝ; වවත්ථිතා, පිරිසුන්හ; එහෙයිනි.

ලොකසංකෙතවශයෙන් පිරිසුන්බැවින් ශාඛාදි සම්බන්ධයක් ඇතිකලද ග්‍රාමසීමාවන් දෙදෙනාගේ සංකරයෙක් නොවෙයි, ලොකව්‍යවහාර සිඩවූ ග්‍රාමසීමාදෙදෙන ඔවුනොවුන් වෘක්ෂාදි සම්බයක් ඇතිකලද සංකරදොෂයට නොපැමිණෙත්, එසේ ලොකව්‍යවහාරයක් නැතිහෙයිනි, එසේමය.

යම්ගමක් අමුතුගමක්හා ගස් වැල් ආදියෙන් සම්බන්ධව සිටි පමණකින් මිශ්‍රවූයේයයි ලොකව්‍යවහාර නොකෙරෙත්, ලොකව්‍යවහාර සිඩ සීමාවන්ගේ මිශ්‍රවීමහෝ නොවීමහෝ ලෝවහරින්ම ගතයුතුයයි චොළියතෙරුන්ගේ මතයකි.

මෙසේ ගාථාත්‍රයකින් සොළිවාදයදක්වා ඒ වාදය ප්‍රතිෂෙධකරණාහු "තාසම්පි" යනාදි කීහු.

**70. තාසම්පිරුක්ඛසාඛාදි සම්බන්ධෙසතිසංකරෙ,**
**අඤ්ඤමඤ්ඤංසීමාඤ්ඤාහිසීමාහිවියයුජ්ජතීනො.**

තාසම්පි, ඒ ග්‍රාමසීමා දෙදෙනාගේද; රුක්ඛසාඛාදි සම්බන්ධෙ සති, වෘක්ෂශාඛාදි සම්බන්ධයක් ඇතිකල්හී; අඤ්ඤාහි සීමාහි විය, අනික් බඩසීමාවන් සමගමෙන්; යුජ්ජතිනො, යුක්තිහෙයින්, අඤ්ඤමඤ්ඤං සංකරොසියා, ඔවුනොවුන්ගේ සංකරයවෙ.

**71. බද්ධාබද්ධසීමානං සංකරාදි විනිච්ඡයං,**
**ගාමසීමාසමානත්තුල්‍යභාවංසමුපකාසියා.**

බද්ධසීමානං. (බද්ධ සමානසංවාසක සංඛ්‍යාත) බද්ධසීමාවන්ගේ; සංකරාදිවිනිච්ඡයං, සංකරාදින්ගේ විනිස; ආදෙවචනා, ආදියෙහි කියා; ගාමසීමාය, ග්‍රාමසීමාවගේ; තත්තුල්‍යභාවං, ඒ බද්ධසීමාවහා සදෘශබව; පකාසිතං, "ගාම නිගම නගර සීමායොපි බද්ධසීමාසදිසායෙව" යන වචනයෙන් ප්‍රකාශකොට.

72. අවිප්පවාසසීමත්තා භාවොවබ්‍යතිරෙකතො,
වුත්තාඅඤ්ඤකථායම්පි නෙතෙ භවන්තිවසංකරෙ.

අවිප්පවාසසීමත්තාභාවොච, ("කෙවලංපනෙතං අවිප්පවාසසම්මුතිං න ලබ්භති" යන වචනයෙන් ග්‍රාමසීමාවගේ) අවිප්පවාසසීමාබවක් නොවීමද, ව්‍යතිරෙකතො, බද්ධසීමාවට වෙනස්හෙයින්; අඤ්ඤකථායං (යසමා)වුත්තො, අටුවාවෙහි යම්හෙයකින් කියනලද්ද;තෙන, ඒ කියනලද කාරණයෙන්; ඉහපි, මේ ග්‍රාමසීමා විෂයෙහිද; සංකරො අත්ථෙව, සංකරඇත්මැයි.

"අඤ්ඤකථායංහි" කියාත් පාඨපෙනෙයි, එසේවුව "හි" ශබ්ද පාදපූරණයෙහිය. "පි" ශබ්ද සාමඤ්ඤගම්‍යයි, සීමාවෝ සීමාවෙක් සමගම සංකරවන්මුත් අසීමාවක්සමග නොවෙත්යයි දක්වනු පිණිස "උදකුක්ඛෙප" යනාදිකිහු.

73. උදකුක්ඛෙපසීමාහි අසංනජ්ජාදිනිස්සයා,
අසීමනිස්සයාතස්මා හොන්තිනොතෙහිසංකරා.

හි, යම්හෙයකින්; අයං නජ්ජාදිනිස්සයා උදකුක්ඛෙපසීමා, මේ නදීආදීන් ආධාරකොට ඇති උදකුක්ඛෙපසීමාතොමෝ; අසීම නිස්සයා, අසීමාවන් නිශ්‍රයකොට ඇත්තීද; තස්මා, එහෙයින්; තෙහිසංකරා නොහොන්ති, ඒ අසීමාවූ නදීආදීන්හා සංකරනොවෙත්.

74. සත්තබ්භන්තර සීමාපි අගාමාරඤ්ඤනිස්සයා,
අසීමනිස්සයාතස්මා හොන්තිනොතෙනසංකරා,

අගාමාරඤ්ඤනිස්සයා, අගාමවූ අරණ්‍යය ආධාරකොට ඇති; සත්තබ්භන්තරසීමාපි, සත්තබ්භන්තරසීමාද; අසීමානිස්සයා, අසීමාවූ අරණ්‍යය ආශ්‍රයකොට ඇත්තී යම්හෙයකින් වේද; (තස්මා යනාදි අර්ථය උක්තාර්ථයි),

75. සීමන්තරෙනසීමාය සංකරෙගහිනිවාරිතො,
අසීමායතුසීමාය සංකරෙගනසම්භවො.

සීමන්තරෙන, සීමාන්තරයක් සමග; සීමායති සංකරො, සීමාව ක්හුාගේම සංකරයතාම; නිවාරිතා, වලතාලද; අසීමායතු, අසී මාවගේ වනාහි; සීමාය, සීමාවක්හා සමග; සංකරා, සංකරයතා මේ; නසම්රිතො, පෙළ අටුවායෙහි නොකියනලදී.

මෙසේ සිධාන්තවාදීහු සීමාවූ ග්‍රාමසීමාදෙදෙන නිශ්‍රයනිශ්‍රිත නොවන බවද, සාඛාදි සම්බන්ධයක් ඇතිකල ඔවුන්නොවුන් සංකරව න බවද, සීමාවූ ග්‍රාමබඩ දෙදෙන නිශ්‍රයනිශ්‍රිත නොවනබවද, සාඛා දි සම්බන්ධයක් ඇතිකල ඔවුනොවුන් සංකරවන බවද, සීමාවූ උදකු ක්ඛෙප සඞ්ඛ්‍යාත තමන්ට ආධාරවූ අසීමාවූ නදී අර ණයන් සමග සංකරනොවන බවද, දක්වීම්වශයෙන් චොළියමත නිරාකරණයකලකල්හි නැවත තමන්ගේ මතය සාධනුපිණිස කාර ණාන්තරයක් දක්වන සොළිහික්ෂූන්ගේ මතය දක්වනුපිණිස "කු ටිලෙණෙසු" යනාදී කීහු.

76\. කුටිලෙණෙසු කුඩ්ඩානමන්තොසීමාසබන්ධනං,
පමුඛෙපිසන්තොවුත්තමන්තොපබ්බජිතතියා.

77\. සීමාසමන්තොකරණමිඑමඑකථායති,
නබද්ධගාමසීමානං සංකරොත්ථිතිවාහුනො.

කුටිලෙණෙසු, සතරභිත්ති ඇති ලෙනෙහි; කුඩ්ඩානං අන්තො පි, භිත්තීන්ගේ ඇතුල්හිද; (ඔවුන්ගේ ඇතුල්හි එක්විසිතමකට ගු න්ට නොපොහොනා කල) පමුඛෙපි, නිසවන්නෙහිද; සීමායබන්ධනං සීමාවගේ බැඳීම; අඑකථායන්තො වුත්තං, අටුවායෙහි යම්හෙයකින් කියනලදද; අතො, එහෙයින්; සීමායං, සීමාවෙහි; පබ්බජිතතියා, ම ත්තෙහි, සෙවනියහා සම්බන්ධවසිටි නිසවතු භිත්තියගේ; අන්ත ක රණං, ඇතුල්හිකොට සීමාසම්මුති කිරීම; ඉඑං, කැමතිවියයුතුයි; ඉ ති, එහෙයින්; බද්ධගාමසීමානං, බඩගාම සීමාවන්ගේ; සංකරො න අත්ථිත්ව, සංකර නැතැතිද; තෙ ආහු, ඒ සොළිහික්ෂූහු කීහු.

"චතුසිකන්ය ලෙනෙපි කුඩ්ඩං අකිත්තෙත්වා පාසානාව කිත්තෙ තබ්බා, අන්තොඔකාසෙ අසති පමුඛෙපි නිමිත්තානි ඨපෙතබ්බානි, එවං ලෙනස්ස අන්තොච බහිච සීමාහොති"යනු අටුවා බැවින් මෙසේ සම්මතකල්හි මැදසිකතියන්සමග ඇතුලතද පිටතද යන දෙදෙනා ට මධ්‍යයෙහි සතරස් සටහන්සීමාවන බැවින් ඇතුලෙහි සිටි ලෙ

තවද පිටසිටී නිසවතතාවද යන දෙදෙනාට මධ්‍යයෙහි මතෙහි සෙ වනීයටද පිටග්‍රාමසීමායෙහිසිටි භිකෂුයටද හැනීසිටි භිකෂූනොමො බඩග්‍රාමසීමා දෙදෙනාගේ සංකරය නොකරෙයි, කෙරේනම් අටුවා යෙහි නොකියයුතුයි, කියනලද්දේමය. එහෙයින් සංකරනැත්තෙය යි හැගෙයි යනු අභිප්‍රායයි,

මේ වොළ්‍රියමතය නිරාකරණයකරණු කැමති සිඩාන්තවාදීහු "බහිකුඩ්ඩා" යනාදි කීහු.

78\. බහිකුඩ්ඩාඤ්ඤසීමාය කුඩ්ඩමන්තොකරණං තථා,
සඞ්දෙතබ්බාභිපෙතත්තා විසෙසෙනෙත්ථ වදන්තිකා.

79\. පමුඛාභිමුඛං කුඩ්ඩ මන්තොකාතබ්බාතිනොදිතං,
තස්මා ධාරනතාරෙණෙව සීමාය හරණං මතං.

බහිකුඩ්ඩාය සීමාය, භිකෂුයෙන් පිටතසිටි සීමාවගේ; කුඩ්ඩ මන්තොකරණං, භිකෂුයගේ ඇතුල්කිරීමෙක්; තථා, නොම ඇත්තේය; තං, ඒ භිකෂුයගේ ඇතුල්කිරීම; එව, මේ ලෙනසීමාවෙහි; යදි අ භිප්පෙතං, කැමතිවනලදනම්; තවපමුඛාභිමුඛං කුඩ්ඩං අන්තොක ත්වාති, ඒ පමුඛයටද ගෙටද මැදසිටි පමුඛයට අභිමුඛවූ භිකෂුයද ඇ තුල්කොට සීමාබැන්දයුතුයයි; [illegible]සෙසෙඩං, වෙසෙසා; (වෙන්කොට) වදනකී, අටුවාචාර්‍යයන් කියන්නාහුය; නොදිතං, එසේ නොකිය නලද; තස්මා, එහෙයින්; ධාරනතාරෙණෙව සීමායහරණං, ලෙනතු ලද නිසවතතාද එක්කොට සීමාව බඳනාකල දොරකඩමැදින්ම සී මාව පිටත්කිරීම; මතං, අටුවාචාර්‍යයන්ට අභිමතය. (එසේකල ගෙ යතුලද නිසවතතාද එකතුකොට භිකෂුයහැර ඇතුල්හි සීමාබන්ධන ය කලබැවින් බඩග්‍රාම සීමාදෙදෙනාගේ සංකරය නොවෙයි යන අභිප්‍රායයි).

මෙසේ සොළීමතය නිරාකරණයකොට කීකල්හි එකගෘහමහප්‍රාසා දයෙහි කෙසේදැයි චොදනාසිත්හිකොට මත්තේ එකම ආධාරයෙ හි සිටියාවූද සංකරදෙෂයට නොපැමිනෙන්නාවූ ග්‍රාමබඩ සීමාව න් දක්වා තමන්ගේ මතය පිහිටුවනු කැමති සිධාන්තවාදීහු "සඞ්දෙ කාස්මිංහපාසාද" යනාදි කීහු.

80\. සඞ්දෙකාස්මිංහපාසාදෙ සණ්ඨාකාරපබ්බතෙ,
ඨානංපච්ඡිමසීමාය පමාණරහිතංසියා.

එකත්ථම්භපාසාද පණවාකාර පබ්බතෙ, එකසතම්භසෙනිකළු ප භයෙහිද උඩ්වාධොභාගදෙකින් පුළුල්ව මැද්දෙහි කුඩාව පණාබෙ ර අයුරෙන් සිටි පර්වතයෙහිද; යං ඨානං, යම් මධ්‍යස්ථානයෙක්; පච්ඡිමසීමාය, පශ්චිම බද්ධසීමාවගේ; පමාණරහිතංසියා, ප්‍රමාණයෙන් වියුක්තවන්නේද; (එක්විසිනමකගේ හිඳිමට නොපොහොනේද.)

**81. තතොධොගාමසීමාච බද්ධසීමාතතොපරි,**
**බද්ධාමෙවගාමසීමාය තාවසාහොතිසංකරා.**

තතො, ඒ නොපොහොණා තැනින්; උපරි, ප්‍රමාණයට පොහොණා යම් මතුතලයෙක්හි; බද්ධසීමාවෙ බද්ධාහොති, බද්ධසීමාවෙක් ඉදින් බඳනාලද්දීද; තතො, ඒ මතුතෙලෙන්; අධො, යට, ගාමසීමා ච, පොළොවහා එකාබද්ධවූ ග්‍රාමසීමාවෙහි; එසා; මේ බද්ධසීමාතොමෝ ග්‍රාමසීමාය, තමහට ආසන්නව සිටි ග්‍රාමසීමාවහා සමග; සංකරා න ච හොති, නොම සංකරවේ.

කුමක්හෙයින්දැයි යනු සඳහා, "පමාණරහිතං" යනාදීකීහු.

**82. පමාණරහිතං ඨානං තතොහරතිසායතො,**
**තතොනඵුසිතාගාම බද්ධසීමා අසංකරා·**

සා, ඒ බද්ධසීමාතොමෝ; යතො, යම්හෙයකින්; පමාණරහිතං ඨානං, පශ්චිම සීමාප්‍රමාණයට නොපොහොනා තැනට; නහිඔතරති, ("තස්සූපරි බද්ධසීමා හෙඨානොතරති" යනු අටුවාබැවින්) නොබසීද; තතො, නොබස්නා හෙයින්; තත්‍ර, ඒ එකටැම්පහඇ එකාධාරයෙහි සිටි; තාපි ගාම බද්ධසීමා අසංකරා, ඒ ග්‍රාම බද්ධ සීමාවෝද අසංකරවෙත්.

**83. අනෙකත්ථම්භපාසාදස්සහෙනාසීමාය බන්ධනං,**
**අනෙනාථම්භසන්තෙහසු නසීමාසංකරාවහං.**

අනෙකත්ථම්භ පාසාදස්ස අනෙනා, නොයෙක්ටැම් සිටුවා කළ පහයේ ඇතුල්හි ටැම්නැති සතර බිත්තුල; සීමාය බන්ධනං, සීමාබැඳීම; අනෙනාථම්භෙසු අසහෙතාසු, ඇතුල්හිටැම් නැතිකල්හි; (ටැම් පිටසිටි බැවින්) නසීමාසංකරාවහං, සීමාසංකරය නො එළවයි; (සීමාසංකරයට නොපමුණුවයි සේයි).

ඒ ප්‍රාසාදයෙහි භිත්තියද මතුතලයද සීමාවෙන් පිටසිටීහෙයින් බාහිරානාම්වේයි—ප්‍රාසාදයාගේ ඇතුල්වූ ප්‍රාන්තතලයවනාහි බද්ධසීමානාම්වේයි යනුභාවයි.

**84. පාසාණත්ථම්භනික්ඛාතා බහිපාසාදභිත්තියා,**
**බද්ධාචෙහොතිපාසාදෙ සීමාවසකලොපිසො.**

පාසාදභිත්තියා බහි, ප්‍රාසාදභිත්තියෙන් පිටසිටි; පාසාණත්ථම්භනිඛාතා, නිම්තක පාෂාණස්තම්භයන් සිටුනයකොට; බද්ධාචෙ හොති, ඉදින් සීමාවක් බඳනාලදද එසේකල; සකලොපිසො පාසාදො, ඒ ප්‍රාසාදයෙක් පොළොන්යුතු සියලුම ඒ පහයතෙම; සීමාඑවහොති, සීමාමවේ.

**85. අසම්බද්ධා සචෙභිත්ති හෙට්ඨා උපරිභූමියා,**
**නාවතරතිසාහෙට්ඨා සාසීමා පරිසම්මතා.**

හෙට්ඨාභිත්ති, යටසිටිභිත්තියොමෝ; උපරිභූමියා, මතුමහලහා සමග; සචෙ අසම්බද්ධා (හොති) අසම්බන්ධව සිටීනම්; උපරියාසීමා සම්මතා, මතුතෙලෙහි යම්සීමාවක් සම්මතද; සා; ඔතොමො; හෙට්ඨා න ඔතරති, යටමහලට නොබසී.

**86. සරම්භාගෙහසීමාභූමි ගාමසීමානතොතිසා,**
**බද්ධාසුපරිසීමාය සංකරානචහොතිසා.**

නතො, නොබස්නාහෙයින්; සරම්භා, මතුමහලට හැනීසිටි වැම් සහිතවූ; ගෙහසීමාභූමි; යටසිටි යම්පොළොවෙක්; ගාමසීමාසියා, ග්‍රාමසීමාවන්නීද; සා, ඒ භූමිතොමෝ; උපරිබද්ධායසීමාය, මතුමහලෙහි බඳනාලද සීමාවහා සමග; සංකරාන්වහොති, සංකරනොමවේ.

**87. වාරිපොක්ඛරපත්තාව සමාසන්නාප්‍යසංකරා**
**අඤ්ඤමඤ්ඤානුපවෙසෙතු ඛීරවාරිවසංකරා.**

සමාසන්නා අපි, මේ ග්‍රාමබද්ධ සීමාදෙදෙනනම් ඔවුනොවුන්ට ඉතා ආසන්නවූවාහුද වාරිපොක්ඛරපත්තා ඉව, දියහා පොකුරුපත් මෙන්; අසංකරා, සංකරනොව සිටියාහු; අඤ්ඤමඤ්ඤානුපවෙසෙතු, පසුව වෘක්ෂාදීන්ගේ අන්‍යොන්‍ය සම්බන්ධවශයෙන් අනුප්‍රවෙශයෙක් ඇතිකළවනාහි; ඛීරවාරිවසංකරා, කිරිහා දියමෙන් මිශ්‍රවෙත්.

**88. ඨානම්හි නජ්ජාසෙතුම්හි උදකුක්ඛෙපමත්තකෙ,**
**පරිවජ්ජිත්වානසීමාය කම්මංකාතුමුදීරිතං.**

නජ්ජාසෙතුම්හි ඨානෙහි, ගඟමධ්‍යයෙහි හෙයසිටි භික්ෂූන්විසින්; උදකුක්ඛෙප මත්තකෙ, උදකුක්ඛෙප ප්‍රමාණයෙන්; පරිවජ්ජිත්වාන සීමාය; පිරිසිඳිනාලද සීමාවෙහි; කම්මං කාතුං, කර්මකරන්ට; උදීරිතං, අට්ඨකථායෙහි කියනලදී.

**89. විසුංතීරෙසුසීමාහි සම්බන්ධෙසතිසෙතුනො,**
**පටික්ඛිත්තංතථාකාතුං අසොධෙත්වානතාපන.**

සෙතුනො, සෙතුහුගේ, විසුංතීරෙසු, ගංදෙතෙරසිටි වෘක්ෂාදියෙන් හෝ; සීමාහි, ග්‍රාමසීමාවෙන් හෝ; සම්බන්ධෙසති, සම්බන්ධයක් ඇති කල්හි; තාපන, උභයතීරයෙහි සිටි ඒ ග්‍රාමසීමාවන්; අසොධෙත්වා සුධනොකොට, න, කර්මනොකට යුතුය; තථාකාතුං, සුධනොකොට කර්මකිරීම; පටික්ඛිත්තං, අට්ඨකථායෙහි ප්‍රතික්ෂිප්තයි.

**90. සෙතුමනොදකුක්ඛෙප ගතංනෙවසංකරෙ,**
**බහිවොහයකොටීහි නජ්ජඅනොගතමෙවච.**

සෙතු, හෙය; අනොදකුක්ඛෙප ගතංචෙ, උදකුක්ඛෙපසීමාව ගේ ඇතුල්හි පවත්තේනම් (සෙතුවෙ—අනොතායි, පදච්ඡෙදයි, බහි වොහයකොටීහි යනතන්හිදමෙසේමැයි) බහි, උදකුක්ඛෙපයෙන් පි ටසිටියාවූ; උභයකොටීහි, දෙකෙළවරින්; නජ්ජඅනොගතං එවච වෙ, නදියතුලපවතීනම්; සංකරොනත්ථි එව, සංකරනැත්මැයි.

“සෙතු” යනු—පුල්ලිඟු ප්‍රථමෙකවචනය අපෙක්ෂාකොට, “අනොදකුක්ඛෙපගතො-අනොතොගතො”යි-කිවමනාතන්හි “ගතං” යි, ලිඟවිපය්‍යාස හෙයින් කීහු.

**91. ගතත්තාසීමතොසීමා එකසම්බන්ධනෙනසයං,**
**නදීඅසීමාසෙතස්සා තස්මානෙවසංකරො.**

සීමතො, උදකුක්ඛෙප පරිච්ඡෙදයෙන් පිටතටගිය උභයකොටී හු; එකසම්බන්ධනෙන, ඒ සීමාවහා එකටසම්බන්ධවීමෙන්, ගතත්තා, පි ටතටගිය බැවින්; සයංසීමා, තොමෙද සීමානම්වෙයි; එතකුදුවූවත් යසා, යම්හෙයකින්; නදී, හෙයදෙකෙළවරට ආධාරවූනදීතොමෝ අසීමා,'අසීමාවේද; තස්මා, එහෙයින්; අස්සාසංකරො නත්ථිඑව, ඇස්සා සංකර නැත්මැයි.

**92. නෙතබ්බා හත්ථපාසං තෙ සෙතුට්ඨා යෙතුභික්ඛවො,**
**න නෙතබ්බාව සබ්බෙතෙ යෙ හොන්ති නදියංසිතා.**

යෙතුභික්ඛවො, සම්මතගණකෙනෙක් වනාහි; සෙතුට්ඨා, හෙය දෙකෙළවර සිටියානුවෙද; තෙ, ඔහු; හත්ථපාසං නෙතබ්බා, අත්පසට පැමිණවිය යුත්තාහුය; යෙ, යම්මහණකෙනෙක්; නදියං සිතා හොන්ති, උභයකොටියෙන් දුරුව නදියෙහි සිටියෝවෙද; තෙසබ්බෙ, ඔහුසියල්ලෝ; නනෙතබ්බා එව, අත්පසට නොපැමිණවිය යුත්තාහුමැයි.

**93. සමන්තා අනුපරියන්තා නිමිත්තෙ කිත්තයුං පුරා,**
**සීමාය සංකරදොසාදිමුත්තා බන්ධිංසු සීහලා.**

**94. පච්ඡාජාතංපි සීමාසු සංකරං පරිවජ්ජයුං,**
**සොධෙත්වා සංඝකම්මානි අකංසු ච මහෙසිනො.**

පුරා, පුරාතනවූ; සීහලා, සිංහලද්වීපවාසීවූ; මහෙසිනො, මහත්වූ ශීලස්කන්ධාදීන් සොයනබැවින් මහර්ෂිනම්වූ මහෙන්ද්‍රස්ථවිරාදි තෙරහු; සමන්තා, සීමාමඬලයට හාත්පස්හි; අනුපරියන්තා, වටඇවිදිනාහු; නිමිත්තෙ කිත්තයුං, නිමිත්කීර්තනය කළෝ; සංකරදොසාදිමුත්තා, සංකරදොෂහා ආදිශබ්දයෙන් සංගෘහීත අතිබුද්ධිකාදි එකොළොස්විපත්ති-නිමිත්ත විපත්ත්‍යාදි ත්‍රිවිධවිපත්තියෙන් මුක්තවූ, සීමා, සීමාවන්; බන්ධිංසු, බැන්ඳ, සීමාසු; සීමායෙහි; පච්ඡාජාතං, පසුව උපන්; සංකරංපි, සංකරයද; පරිවජ්ජයුං, දුරුකළෝ; සොධෙත්වා සංඝකම්මානි අකංසුච, (සොධෙත්වා පබ්බාජෙථ සොධෙත්වා උපසම්පාදෙථ) යනු අටුවාබැවින්; සීමාවන් ශුඬකොට සංඝකර්මකළාහුයි.

**95. එවං නිරාකතං සබ්බං චොළියානුමතං මතං,**
**පතිට්ඨාපිතමච්චන්තං සීහලානුමතං මතං.**

එවං, මේ යථොක්තප්‍රකාරයෙන්; චොළියානුමතං, සොළීතෙරුන්ගේ ලබ්ධිවූ; සබ්බංමතං, සියළුමතය; නිරාකතං, වළකනලද; සීහලානුමතං, හෙළ ද්විවැස්සන්ගේ ලබ්ධිවූ; මතං, ලබ්ධිතොමෝ; අච්චන්තං, අතිශයින්; පතිට්ඨාපිතං, පිහිටුවනලදු.

සීහලො අස්ස නිවාසොති, වසතීති සීහලො-ජනපදවාචී සීහළ ශබ්දයා කෙරෙන්, "ණරාගාදීන්" නිවාසාර්ථයෙහි ණප්‍රත්‍යයවූ තැනී.

චෙසේගතයුතු හළයුතු මතදක්වා කරුණුදක්වීම් වශයෙන් ගැණීම් හැරීම් පිණිස "උපාදෙසං" යනාදි හිනු.

**96. උපාදෙයමිදංයෙව සීහළානුමතංමතං,**
**පාළිඅට්ඨකථාගණ්ඨිපදනමවිරොධිනං.**

පාළිඅට්ඨකථාගණ්ඨිපදනං අවිරොධිනං, පෙළ අටුවා ගැටපදයන්ට අවිරුද්ධවූ; සීහළානුමතං, සිංහලාචාර්‍යයන්ගේ ලබ්ධිවූ; ඉදංමතං, මේමතය; උපාදෙයං යෙව, ගතයුතුමය.

**97. තබ්බිරුද්ධනතුහෙය්‍යනතං චොළියානුමතංමතං.**
**සාසනට්ඨිතිකාමෙහි විනයඤ්ඤූහිසබ්බසො.**

තබ්බිරුද්ධනතු, ඒ පෙළආදියට විරුද්ධවූ, චොළියානුමතං, චොළීයලබ්ධිවූ; තංමතං, ඒමතය; සාසනට්ඨිතිකාමෙහි, භාග්‍යවතුන්ගේ පර්‍යාප්ති ශාසනය තුන්සසුන්හෝ චිරාත්කාලයක් මුලුල්ලෙහි පිහිටුවනු කැමතිවූ, විනයඤ්ඤූහි, විනයධරයන් විසින්; සබ්බසො, සර්‍වප්‍රකාරයෙන්; හෙය්‍යං, හලයුතු.

දැන් සීමාදුල්ලබ්ධිය දුරුකල දහල්නු නමත්සදහා දක්වනුපිණිස "නිරාකරණමෙතං" යනාදී කීහු.

**98. නිරාකරණමෙතං සො සීමාදුල්ලබ්ධියා අකා,**
**වාගිස්සරාභිධානොයො සීහළාචරියොයති.**

වාගිස්සරාභිධානො, වාගීශ්වරනම්වූ; සීහළාචරියො යොයතී අ සි, (සිංහබාහුරජ නමත්ගේ පියවූ සිංහයා මැරූබැවින්, "සිහංලා ති" යන නිර්වචනයෙන් සිහළනම, ඔහුව සම්බන්ධවූ සියල්ලෝද. "උපචාර" ලක්ෂණයෙන් සිහළනම්වෙත්; මෙමැතිහු '**සීහබාහුනරින්දො,සො සීහමාදින්නවාඉති. සීහළොතෙනසම්බන්ධා අහුසබ්බෙපිසීහළා**") සිංහලාචාර්‍ය යම් තෙරනුකෙනෙක් ඇද්ද; සො, හෙතෙම; සීමාදුල්ලබ්ධියා, සීමාදුල්ලබ්ධියගේ; එතං නිරාකරණං, මේ දුරුකිරීම; (හෙවත් සීමාදුල්ලබ්ධිය දුරුකරන්නාවූ මේ ප්‍රකරණය) අකා, කෙළේයි.

**99. යෙනවිරචිතො ආසි සීමාලඞ්කාරසඞ්ගහො.**
**තෙනෙවරචිතාතස්ස වණ්ණනාපිසමාසතො.**

යෙන, යම් වාගිස්සරනම් තෙරකෙනෙක් විසින්; සීමාලඞ්කාරසඞ්ගහො විරචිතො ආසි, සීමාලඞ්කාරසංග්‍රහයතෙම රචනාකරණ ලද්ද; තෙනෙව, ඒ තෙරුන්විසින්ම; තස්සවණ්ණනාපි, ඒ සීමාලඞ්කාරසංග්‍රහවර්ණනාවද; සමාසතො, සැකෙවින්; විරචිතා, රචනාකරණලදී.

**100. චිරංතිට්ඨතුසද්ධම්මො ධම්මරාජස්සසත්ථුනො.**
**සබ්බෙපිපාණිනොහොන්තු සද්ධම්මෙසාදරාසදා.**

**සමත්තොචායංගන්ථො.**

---

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු